**ශීර්ෂය 220 - ආයුර්වේද දෙපාර්තමේන්තුව**

**-----------------------------------------------**

1. **මූල්‍ය ප්‍රකාශන**

**-----------------**

## 1.1 තත්ත්වාගණනය කළ විගණන මතය

**---------------------------------------**

ආයුර්වේද දෙපාර්තමේන්තුවේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශයෙන් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ආයුර්වේද දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 31 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 මැයි **31** දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට ආයුර්වේද දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම

**--------------------------------------------------------**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

**-----------------------------------------------------------------------------------------------------**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) වගන්තිය ප්‍රකාරව, ආයුර්වේද දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38 (1) (ඇ) උප වගන්තිය ප්‍රකාරව, ආයුර්වේද දෙපාර්තමේන්තුව මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් පිළියෙල කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ

සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායී ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

-----------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයින් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලකිලිමත් විය යුතුය.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීමෙන් වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.
- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.
- සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී, මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත්වී ඇති බව.

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

---------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) ආයුර්වේද දෙපාර්තමේන්තුව විසින් ඉකුත් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින්, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමඟ අනුරූපී වන බව ප්‍රකාශ කළ නොහැකි විය.

(ආ) දෙපාර්තමේන්තුව විසින් ඉකුත් වර්ෂයට අදාළව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින්, ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කර නොතිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 ගිණුම් ඉදිරිපත් කිරීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| **(අ) වාර්ෂික මූල්‍ය ප්‍රකාශන** | | |
| 2018 නොවැම්බර් 21 දිනැති අංක 267/2018 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව වාර්ෂික මූල්‍ය ප්‍රකාශන 2019 පෙබරවාරි 28 දිනට ප්‍රථම විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද, එය දින 18 ක ප්‍රමාදයකින් පසු 2019 මාර්තු 19 දින විගණනයට ඉදිරිපත් කර තිබුණි. | රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. | පෙර වර්ෂවලට සාපේක්ෂව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ ආකෘතිය සංකීර්ණවීම හා රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් මූල්‍ය ප්‍රකාශන තුළ ඇති සටහනක් වෙනස්කර එවන ලෙස දැනුම්දීම නිසා මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම ප්‍රමාදවූ බව සහ ඉදිරියේදී නියමිත දිනට ඉදිරිපත් කරන බව. |
| **(ආ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳව වූ සැසඳුම් ප්‍රකාශය** | | |
| ඉහත සඳහන් රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය 2019 පෙබරවාරි 28 දින හෝ ඊට පෙර විගණනයට ඉදිරිපත් කළ යුතු වුවත්, එය මාස 02 ක ප්‍රමාදයකින් පසුව 2019 අප්‍රේල් 30 දින විගණනයට ඉදිරිපත් කර තිබුණි. | රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. | අදහස් දක්වා නැත. |

**1.6.2 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය**

-----------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2018 නොවැම්බර් 21 දිනැති අංක 267/2018 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 3 ඡේදය ප්‍රකාරව මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ සංඛ්‍යා, භාණ්ඩාගාර අවසාන ගිණුම් ප්‍රකාශවල සඳහන් සංඛ්‍යාවලට අනුකූල විය යුතුව තිබුණි. විගණනයට ඉදිරිපත් කළ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ භාණ්ඩාගාර අවසාන ගිණුම් ප්‍රකාශවල සඳහන් සංඛ්‍යාවලට වඩා පහත පරිදි රු.මිලියන 101.11 ක් අඩුවෙන් රු.මිලියන 1,847.97 ක් මුළු ආදායම් ලැබීම් වශයෙන් දක්වා තිබුණි. | | |
| (i) | භාණ්ඩාගාර අවසන් ගිණුම් ප්‍රකාශන අනුව තැන්පත් ලැබීම් රු.මිලියන 24.57 ක් වී තිබුණත්, මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ එය රු.මිලියන 3.56 ක් අඩුවෙන් රු.මිලියන 21.01 ක් ලෙස දක්වා තිබුණි. | 2018 නොවැම්බර් 21 දිනැති අංක 267/2018 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. | හරස් සටහන් ඇතුළත් නොකර තැන්පතු ලැබීම් ගණනය කර මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයට ඇතුළත් කර ඇති බැවින් විගණනය විසින් දක්වා ඇති වටිනාකම් සමඟ නොසැසඳේ. |
| (ii) | භාණ්ඩාගාර අවසන් ගිණුම් ප්‍රකාශන අනුව අත්තිකාරම් ලැබීම් රු.මිලියන 43.86 ක් වී තිබුණත්, මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ රු.මිලියන 42.07 ක් අඩුවෙන් රු.මිලියන 1.79 ක් ලෙස දක්වා තිබුණි. | රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. | හරස් සටහන් ඇතුළත් නොකර අත්තිකාරම් ලැබීම් ගණනය කර මූල්‍ය කාර්යසධන ප්‍රකාශනයට ඇතුළත් කර ඇති බැවින් විගණනය විසින් දක්වා ඇති වටිනාකම් සමඟ නොසැසඳේ. |
| (iii) | ඉහත සඳහන් චක්‍රලේඛයේ 7(ii) ඡේදය ප්‍රකාරව | රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ | හරස් සටහන් ඇතුළත් නොකර වෙනත් ලැබීම් |

| | | | |
|---|---|---|---|
| | වෙනත් ආදායම් ගණන්දීමේ නිලධාරීන් වෙනුවෙන් දෙපාර්තමේන්තුව රැස්කළ රු.මිලියන 71.56 ක් භාණ්ඩාගාරයෙන් ලද අග්‍රිම ලෙස සලකා වෙනත් ලැබීම් ලෙස සඳහන් කළ යුතුව තිබුණත්, එම ආදායමෙන් රු.මිලියන 55.48 ක් අඩුවෙන් රු.මිලියන 16.08 ක් ලෙස සඳහන් කර තිබුණි. | විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. | ගණනය කර මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයට ඇතුළත් කර ඇති බැවින් විගණනය විසින් දක්වා ඇති වටිනාකම් සමඟ නොසැසඳේ. |
| (ආ) | ඉහත සඳහන් චක්‍රලේඛයේ උපදෙස් පරිදි භාණ්ඩාගාරයේ අවසන් ගිණුම් ප්‍රකාශනවල සඳහන් සංඛ්‍යා පදනම් කර ගනිමින් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ වියදම් දැක්විය යුතුව තිබුණද, එම උපදෙස්වලට පටහැනිව කටයුතු කිරීම නිසා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ ඇතුළත් වියදම රු.මිලියන 103.07 ක් අඩුවෙන් දක්වා තිබුණි. විස්තර පහත දැක්වේ. | | |
| (i) | භාණ්ඩාගාර අවසාන ගිණුම් ප්‍රකාශන අනුව පුනරාවර්තන හා මූලධන වියදම රු.මිලියන 2,032.04 ක් වී තිබුණත්, මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ එය රු.මිලියන 85.54 ක් අඩුවෙන් රු.මිලියන 1,946.50 ක් ලෙස දක්වා තිබුණි. | රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. | හරස් සටහන් හා වැය විෂයන් සඳහා කරන ලද අධිහාර ඇතුළත් නොකළ පුනරාවර්තන හා මූලධන වියදම් පමණක් දක්වා ඇති බැවින් විගණනය විසින් දක්වා ඇති වටිනාකම් සමඟ නොසැසඳේ. |
| (ii) | භාණ්ඩාගාර අවසාන ගිණුම් ප්‍රකාශන අනුව තැන්පත් ගෙවීම රු.මිලියන 26.68 ක් වී තිබුණත්, එය මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ රු.මිලියන 5.62 ක් අඩුවෙන් රු.මිලියන 21.06 ක් ලෙස දක්වා තිබුණි. | රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. | හරස් සටහන් ඇතුළත් නොකර තැන්පතු ගෙවීම් ගණනය කර මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයට ඇතුළත් කර ඇති බැවින් විගණනය විසින් දක්වා ඇති වටිනාකම් සමඟ නොසැසඳේ. |
| (iii) | භාණ්ඩාගාර අවසාන ගිණුම් ප්‍රකාශන අනුව | රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ | හරස් සටහන් ඇතුළත් නොකර අත්තිකාරම් ගෙවීම් |

| | | | |
|---|---|---|---|
| | අත්තිකාරම් ගෙවීම් රු.මිලියන 64.74 ක් වී තිබුණත්, මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ එය රු.මිලියන 11.90 ක් අඩුවෙන් රු.මිලියන 52.84 ක් ලෙස දක්වා තිබුණි. | විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. | ගණනය කර මූල්‍ය කාර්යසධන ප්‍රකාශනයට ඇතුළත් කර ඇති බැවින් විගණනය විසින් දක්වා ඇති වටිනාකම් සමඟ නොසැසඳේ. |
| (ඇ) | මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය අනුව 2018 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ගිණුමේ ශේෂය (අවාසි) රු.මිලියන 172.41 ක් වී තිබුණත්, ඉහත සඳහන් (අ) හා (ආ) හි සඳහන් නිරීක්ෂණ අනුව එම ශේෂය (අවාසි) රු.මිලියන 174.37 ක් විය යුතුව තිබුණි. ඒ අනුව මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ එම ශේෂය රු.මිලියන 1.96 ක් අඩුවෙන් දක්වා තිබුණි. | රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. | හරස් සටහන් ඇතුළත් නොකර අග්‍රිම ගිණුමේ ශේෂය ගණනය කර මූල්‍ය කාර්යසධන ප්‍රකාශනයට ඇතුළත් කර ඇති බැවින් විගණනය විසින් දක්වා ඇති වටිනාකම් සමඟ නොසැසඳේ. |
| (ඇ) | ඉහත සඳහන් රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 7(vi) ඡේදය ප්‍රකාරව අක්මුදල් ගැලපුම් ගිණුමක් පිළියෙල කළ යුතුව තිබුණත්, දෙපාර්තමේන්තුව විසින් පිළියෙල කර තිබුණු අක්මුදල් ගැලපුම් ගිණුම එම උපදෙස් අනුව පිළියෙල කර නොතිබුණි. | රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. | චක්‍රලේඛය ප්‍රකාරව පිළියෙල කළ අක්මුදල් ගැලපුම් ගිණුම ඉදිරිපත් කර ඇති බව. |

**1.6.3 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| දේපල, පිරියත හා උපකරණවල වටිනාකම ලෙස මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ රු.මිලියන 2,815.87 ක් දක්වා තිබුණත්, භාණ්ඩාගාර වත්කම් ප්‍රකාශය අනුව එම වටිනාකම රු.මිලියන 4,303.98 ක් වී තිබුණි. ඒ අනුව වත්කම්වල වටිනාකම රු.මිලියන 1,488.11 ක් අඩුවෙන් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ දක්වා තිබුණි. | 2018 නොවැම්බර් 21 දිනැති අංක 267/2018 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. | CIGAS වැඩසටහනට සියලුම වත්කම් ඇතුළත් කිරීම අවසන්ව නොමැති බැවින් මෙම ශේෂය සංසන්දනය කළ නොහැකි බව හා සියලුම වත්කම් ඇතුළත් කිරීමෙන් අනතුරුව විගණනය විසින් පෙන්වා දෙන ලද වෙනස සැසඳිය හැකි බව. |

**1.6.4** **මුදල් ප්‍රවාහ ප්‍රකාශය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| (අ) මුදල් ප්‍රවාහ ප්‍රකාශනය අනුව මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය ලෙස රු.මිලියන 1,825.17 ක් දක්වා තිබුණි. විගණනය සඳහා ඉදිරිපත් කළ මාසික ගිණුම් සාරාංශ හා වෙනත් තොරතුරු අනුව එම වටිනාකම රු.මිලියන 1,905.27 ක් වී තිබුණි. ඒ අනුව රු.මිලියන 80.10 ක් අඩුවෙන් දක්වා තිබුණි. | 2018 නොවැම්බර් 21 දිනැති අංක 267/2018 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. | මුදල් ප්‍රවාහ ප්‍රකාශනය තුළ දක්වා ඇති වටිනාකම් තුළ හරස් සටහන් ඇතුළත්ව නොමැති නමුත් විගණනය විසින් ගණනය කරන ලද වටිනාකම් තුළ හරස් සටහන් ඇතුළත්ව ඇති බැවින් මෙම වෙනස නිරූපනය වන බව. |
| (ආ) මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහයේ වටිනාකම ලෙස රු.මිලියන 1,352.94 ක් දක්වා තිබුණත්, විගණනය සඳහා ඉදිරිපත් කළ මාසික ගිණුම් සාරාංශ හා වෙනත් තොරතුරු අනුව එම වටිනාකම රු.මිලියන 1,511.17 ක් වී තිබුණි. ඒ අනුව රු.මිලියන 158.23 ක් අඩුවෙන් දක්වා තිබුණි. | -ඉහත පරිදි- | -එම- |
| (ඇ) ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයේ කිසිදු ලැබීමක් මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ සඳහන් කර නොතිබුණත්, රජයේ නිලධාරීන්ට ලබා දුන් ණය අත්තිකාරම්වලින් ආපසු අයකර ගත් වාරික වටිනාකම වූ රු.මිලියන 39.54 ක් ඒ යටතේ දක්වා නොතිබුණි. | -ඉහත පරිදි - | -එම- |

| | | |
|---|---|---|
| (ඇ) ආයෝජන ක්‍රියාකාරකම් වෙනුවෙන් වැය කළ මුදල් ප්‍රවාහය ලෙස රු.මිලියන 421.14 ක් මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ සඳහන් කර තිබුණත්, විගණනය වෙත ඉදිරිපත් කළ මාසික ගිණුම් සාරාංශ හා වෙනත් තොරතුරු අනුව එම වටිනාකම රු.මිලියන 433.59 ක් වී තිබුණි. ඒ අනුව රු.මිලියන 12.45 ක් අඩුවෙන් දක්වා තිබුණි. | -ඉහත පරිදි - | -එම- |
| (ඉ) දෙපාර්තමේන්තුව විසින් මූල්‍ය ක්‍රියාකාරකම්වල යෙදී නොතිබුණත්, ඒ යටතේ වැය කිරීම් ලෙස රු.මිලියන 51.08 ක් දක්වා තිබුණි. | -ඉහත පරිදි - | -එම- |

**1.6.5 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසැඳුම් ප්‍රකාශය**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| ඉදිරිපත් කරන ලද මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයට අනුව, 2018 දෙසැම්බර් 31 දිනට රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුමේ ශේෂය රු.මිලියන 108.80 ක් වී තිබුණි. දෙපාර්තමේන්තුවේ පාලන ගිණුමට හා කේවල ශේෂ ලැයිස්තුවට අනුව එම ණය ශේෂය පිළිවෙලින් රු.මිලියන 101.11 ක් හා රු.මිලියන 108.16 ක් වූයෙන් වෙනස පිළිවෙලින් රු.මිලියන 7.69 ක් හා රු.මිලියන 0.64 ක් වී තිබුණි. | මුදල් රෙගුලාසි 427 ප්‍රකාරව කටයුතු කළ යුතුය. | මෙම ණය ශේෂ අයකර ගැනීම සඳහා නීතිමය කටයුතු කිරීමට විමර්ශණ හා නීති නිලධාරී වෙත පවරා ඇති අතර එම කටයුතු සිදුකෙරෙමින් පවතින බව. |

**1.6.6 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ඇතැම් ලේඛන පවත්වා නොතිබුණු අතර, ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| **(අ) ඇප ලේඛනය** | | |
| ඇප තැබිය යුතු නිලධාරින් හා සේවකයන්ගේ තොරතුරු ඇතුළත් ඇප ලේඛනයක් පිළියෙල කර නොතිබුණි. | මුදල් රෙගුලාසි 891(1) ප්‍රකාරව කටයුතු කළ යුතුය. | මෙම ලේඛනය පවත්වාගෙන යෑමට පාලන අංශය දැනුවත් කර ඇති බව. |
| **(ආ) විදුලි උපකරණ පිළිබඳ ලේඛනය** | | |
| විදුලි උපකරණ පිළිබඳ ලේඛනයක් පවත්වා නොතිබුණි. | මුදල් රෙගුලාසි 454(2) ප්‍රකාරව කටයුතු කළ යුතුය. | මෙම ලේඛනය පවත්වාගෙන යාමට සංවර්ධන අංශයට පවරා ඇති බව. |
| **(ඇ) හානි පිළිබඳ ලේඛනය** | | |
| හානි පිළිබඳ ලේඛනය යාවත්කාලීන කර නොතිබුණි. | මුදල් රෙගුලාසි 110 ප්‍රකාරව කටයුතු කළ යුතුය. | පාලන අංශය විසින් යාවත්කාලීන කරමින් පවතින බව. |

**1.6.7 විගණන සාක්ෂි නොවීම**

පහත සඳහන් ගනුදෙනු සම්බන්ධයෙන් විගණන සාක්ෂි ඉදිරිපත් කර නොතිබුණි.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය නොවන වත්කම්වල පිරිවැය රු.මිලියන 2,815.87 ක් වී තිබුණත්, යාවත්කාලීන කරන ලද ස්ථාවර වත්කම් ලේඛනය, භාණ්ඩ සමීක්ෂණ වාර්තා හා වෙනත් ප්‍රමාණවත් සාක්ෂි | දෙපාර්තමේන්තුව සතු මූල්‍ය නොවන වත්කම්වල මූලාශ්‍ර තොරතුරු පදනම් කර ගනිමින් තොරතුරු ලේඛනගතකර වත්කම් සත්‍යාපනය සඳහා ඉදිරිපත් කළ යුතුය. | භාණ්ඩ සමීක්ෂණ කටයුතු නිමවූ වහාම එම වාර්තා ලබා දීමට කටයුතු කරන බව හා ස්ථාවර වත්කම් ලේඛනය සිගැස් වැඩසටහනට ඇතුළත් කර ඉදිරිපත් කරන බව. |

විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එම වත්කම් සතුටුදායක ලෙස සත්‍යාපනය කළ නොහැකි විය.

**1.6.8 ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | දෙපාර්තමේන්තුව මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් පිළියෙල කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායීතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යැමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. | ඉදිරියේදී මේ පිළිබඳව කටයුතු කිරීමට සටහන් කරගත් බව. |
| (ආ) | වාර්ෂික සහ වෙනත් මූල්‍ය ප්‍රකාශන අවශ්‍ය වේලාවන් ඇතුළත පිළියෙල කිරීම සිදු වන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී විසින් සහතික විය යුතු අතර, ඊට අමතරව විගණනය කරනු ලබන ආස්ථිතයට අදාළ වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වගබලාගත යුතු වුවත්, එම අවශ්‍යතා ඉටු කර නොතිබුණි. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. | මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර අවසන් වුවද, කාර්යසාධන වාර්තාවේ කටයුතු අවසන්ව නොතිබුණු බැවින් තවදුරටත් ප්‍රමාදවීම වැළැක්වීම සඳහා එතෙක් කෙටුම්පත් කර තිබුණු කාර්යසාධන වාර්තාව අමුණා එවීමට සිදුවූ බව. මේ වන විට කාර්යසාධන වාර්තාව අමාත්‍යාංශය වෙත අනුමැතිය සඳහා යොමු කර ඇති බව. |
| (ඇ) | අභ්‍යන්තර විගණන කර්තව්‍ය නිසි පරිදි ක්‍රියාත්මක කිරීම සඳහා ඵලදායී ක්‍රමවේදයක් ඇති බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු වුවත්, එම අවශ්‍යතාවය ඉටු | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. | මානව සම්පත් හිඟකම මීට හේතුවී ඇති බව. |

කර නොතිබුණි.

## 1.6.9 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| විගණන නිරීක්ෂණය<br>නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | <br>අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 633 | රජයේ මුද්‍රණාලයාධිපති විසින් ඉටුකළ නොහැකි බව දන්වන මුද්‍රණ කටයුතු පමණක් අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය සහිතව පෞද්ගලික මුද්‍රණ ආයතනවලින් ඉටුකර ගත යුතු වුවද, එම අනුමැතිය ලබා නොගෙන පෞද්ගලික මුද්‍රණ ආයතන වෙත රු.මිලියන 1.68 ක් ගෙවා මුද්‍රණ කාර්යයන් 04 ක් ඉටුකර ගෙන තිබුණි. | මුදල් රෙගුලාසි විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. | ඉදිරියේ දී ඔබ විසින් පෙන්වා දී ඇති පරිදි කටයුතු කිරීමට සටහන් කරගත් බව. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 ආදායම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු ආදායම් ඇස්තමේන්තුව අනුව වෙනත් ආදායම් රු.මිලියන 15.35 ක් වී තිබුණු නමුත් තථ්‍ය වෙනත් ආදායම රු.මිලියන 29.05 ක් වීම නිසා විචලනය රු.මිලියන 13.70 ක් හෙවත් සියයට 89 ක් වී තිබුණි. | මුදල් රෙගුලාසි 85(1)(ඇ) ප්‍රකාරව කටයුතු කළ යුතුය. | ඇස්තමේන්තු පිළියෙල කිරීම සියයට 100 කින් නිවැරදිව පිළියෙල කළ නොහැකි අතර ඉදිරියේදී උපරිම නිවැරදි ආකාරයට ඇස්තමේන්තු සකස් කිරීමට කටයුතු කරන බව. |

**2.2 වියදම් කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) මුදල් රෙගුලාසි 50 හි දැක්වෙන විධිවිධාන ප්‍රකාරව නිවැරදි හා තාත්ත්වික ඇස්තමේන්තු පිළියෙල කර නොතිබුණු බව පහතින් දැක්වෙන නිරීක්ෂණවලට අනුව තහවුරු විය. | | |
| (i) දෙපාර්තමේන්තුව සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 2,241.60 ක් වුවද, 2018 දෙසැම්බර් 31 දින වන විට ඉන් රු.මිලියන 2,032.04 ක් පමණක් උපයෝජනය කර තිබුණු බැවින් ශුද්ධ ප්‍රතිපාදනයන්ගෙන් ඉතිරිවීම් රු.මිලියන 209.55 ක් වී තිබුණි. | මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව කටයුතු කළ යුතුය. | 2018 වර්ෂය සඳහා මුළු ශුද්ධ ප්‍රතිපාදනයේ ඉතිරිය රු.209,557,018 ක් වන නමුත් මෙම ප්‍රතිපාදන තුළින් රු.90,374,830 ක බිල්පත් සහ වෙනත් දෙපාර්තමේන්තු වෙත පවරන ලද ප්‍රතිපාදනයෙන් රු.49,302,261 ක බිල්පත් අක්මුදල් නොමැති වීම මත ඉතිරිව ඇති බව. |
| (ii) පුනරාවර්තන වැය විෂයයන් 03 ක් සඳහා පරිපූරක ඇස්තමේන්තු වෙන්කිරීම් මගින් රු.මිලියන 40.50 ක ප්‍රතිපාදන ලබා ගෙන තිබුණත් 2018 දෙසැම්බර් 31 දින වන විට ඉන් රු.මිලියන 27.32 ක් උපයෝජනය නොකර ඉතිරි කර තිබුණි. | පරිපූරක අයවැය ඇස්තමේන්තු වෙන්කිරීම් මගින් ප්‍රතිපාදන ලබා ගැනීමේදී අවශ්‍යතාවයට සරිලන පරිදි නිවැරදිව ඇස්තමේන්තු කළ යුතුය. | පුනරාවර්තන වැය විෂයයන් යටතේ 2018 දෙසැම්බර් 31 දිනට ඉතිරිව පැවති ප්‍රතිපාදන සඳහා බැඳීම් තිබුණු අතර, ප්‍රමාණවත් අක්මුදල් නොමැතිවීම මත අදාළ වවුචර් නිරවුල් කිරීමට නොහැකි වූ බැවින් පරිපූරක ඇස්තමේන්තු ප්‍රතිපාදනවල ඉතිරිවීමක් පෙන්වන බව. |
| (iii) මුදල් රෙගුලාසි 66 ප්‍රකාරව පුනරාවර්තන වැය විෂයයක් හා මූලධන වැය විෂයයන් 05 ක් සඳහා රු.මිලියන 75.75 ක් ප්‍රතිපාදන මාරු කර තිබුණු නමුත් 2018 දෙසැම්බර් 31 දින වන විට එම වැය විෂයයන් 06 හි මුළු ඉතිරිය රු.මිලියන 78.52 ක් වී තිබුණි. | නිවැරදි ඇස්තමේන්තු කිරීමකින් ප්‍රතිපාදන මාරුකර ගැනීමට කටයුතු කළ යුතුය. | ආයුර්වේද රෝහල් සහ දෙපාර්තමේන්තුවට අනුබද්ධ ආයතනයන්හි අත්‍යවශ්‍ය අලුත්වැඩියා වෙනුවෙන් මු.රෙ. 66 යටතේ ප්‍රතිපාදන මාරු කර ගොඩනැඟිලි දෙපාර්තමේන්තුව වෙත පවරා දුන් නමුත් ප්‍රමාණවත් අක්මුදල් නොලැබීම මත මෙම ඉතිරිවීම් පෙන්වන බව. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ප්‍රසම්පාදන කටයුතු නිසි පරිදි නිම නොකිරීම, ප්‍රතිපාදන පැවරීම් වර්ෂය මුලදී සිදු කර නොතිබීම හා සමහර කාර්යයන් ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර නොතිබීම වැනි හේතු මත මූලධන වැය විෂයයන් 17 ක් සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 148.41 කින් රු.මිලියන 117.56 ක් ඉතිරි කර තිබුණි. එම ඉතිරිය සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් සියයට 55 ක සිට සියයට 100 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් වී තිබුණි. | මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව කටයුතු කළ යුතුය. | අයවැය ඇස්තමේන්තුව යටතේ වෙන් වූ සීමිත ප්‍රතිපාදන රෝහල් අවශ්‍යතාවය මත පෙළ ගස්වා ඉන් ප්‍රමුඛත්වය දිය යුතු ඉදිකිරීම් හා අලුත්වැඩියාවන් සඳහා ප්‍රතිපාදන පවරා දෙන ලදී. ඒ අනුව අවශ්‍යතාවය පරිදි ප්‍රතිපාදන මාරු කිරීමට අවසර ගෙන අදාළ පැවරීම් කිරීමට සිදු වූ බැවින්, වසර මුලදී අදාළ පැවරීම කිරීමට නොහැකි වූ බව. |
| (ඇ) | 220-02-03-4-2507 දරන පර්යේෂණ හා සංවර්ධන වැය විෂයය සඳහා සලසා තිබුණු රු.මිලියන 40 ක ප්‍රතිපාදන පර්යේෂණ හා සංවර්ධන කාර්යයන් සඳහා වැයකර නොතිබුණි. ඒ වෙනුවට කාර්යමණ්ඩල ධාරිතා පුහුණු වැඩසටහනක් සඳහා රු.138,700 ක් හා ආයුර්වේද වෛද්‍යවරු තිදෙනෙකුගේ පශ්චාත් උපාධි පාඨමාලා ගාස්තු සඳහා රු.569,295 ක් වැය කර තිබුණි. | පාර්ලිමේන්තුව විසින් අනුමත කර ඇති කාර්යයන් ඉටුකිරීම කෙරෙහි අවධානය යොමු කළ යුතුය. | 220-01-01-2401 හා 220-02-04-2401 යන වැය විෂයයන්වල ප්‍රතිපාදන අවසන් වී තිබුණු බැවින් ධාරිතා සංවර්ධන හා පුහුණු වැඩසටහන් සියලුම නිලධාරීන්ට හා සේවකයින්ට අත්‍යවශ්‍ය බැවින් මාගේ අභිමතය පරිදි පර්යේෂණ හා සංවර්ධන වැය විෂයයේ ඉතිරිව තිබුණු ප්‍රතිපාදන වලින් මෙම වියදම දරා ඇත. තවද පශ්චාත් උපාධි පාඨමාලා සඳහා වියදම් කළ මුදල සඳහා පිළිතුරු සැපයීමට අවශ්‍ය ලේඛන ඔබ අංශය සතු බැවින් ලිපිලේඛන ලද පසු පිළිතුරු සපයන බව. |

**2.3 බැරකම් හා බැඳීම්වලට එළඹීම**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| බොරැල්ල රෝහල ඉදිකිරීමට අදාළව 2018 දෙසැම්බර් 31 දිනට වූ රු.මිලියන 47.23 ක් වූ බැරකම්, බැරකම් පිළිබඳ ප්‍රකාශයට ඇතුළත් කර නොතිබීම හේතුවෙන් ඊට සමාන අගයකින් බැරකම් අඩුවෙන් දක්වා තිබුණි. කෙසේ වෙතත් 2019 වර්ෂය සඳහා භාණ්ඩාගාරයෙන් බැරකම් පියවීම සඳහා රු.මිලියන 159.35 ක ප්‍රතිපාදන අයදුම් කර තිබුණි. | සමාලෝචිත වර්ෂයට අදාළ වූ සියළු බැරකම් නියමිත පරිදි අනාවරණය කරගැනීම සඳහා ක්‍රමවේදයක් ස්ථාපිත කළ යුතුය. | බැරකම්වලට අදාළ සියළු වවුචර්පත් 2019 පෙබරවාරි මාසය වන තෙක් ගිණුම් අංශයට නොලැබී ඇති බැවින් එම වවුචර් බැරකම් ප්‍රකාශයෙහි දක්වා නොමැති බව. |

**2.4 වෙනත් දෙපාර්තමේන්තු වෙත ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂයේදී ගොඩනැගිලි දෙපාර්තමේන්තුව වෙත ඉදිකිරීම් කාර්යයන් 21 ක් පවරා තිබුණු අතර ඒ සඳහා රු.මිලියන 110.74 ක ප්‍රතිපාදන සලසා තිබුණි. 2018 දෙසැම්බර් 31 දින වන විට එම ප්‍රතිපාදනවලින් රු.මිලියන 103.27 ක් ඉතිරි කර තිබුණි. ඒ අනුව මූල්‍ය ප්‍රගතිය සියයට 7 ක් පමණක් වී තිබුණු අතර භෞතික ප්‍රගතිය පිළිබඳව තොරතුරු විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. | සුළු පරිමාන ඉදිකිරීම්වල ප්‍රසම්පාදන කටයුතු දෙපාර්තමේන්තුව විසින් සිදුකර, දෙපාර්තමේන්තුව තුළ සිටින ඉංජිනේරුවරයා, ඉංජිනේරු සහායක හා තාක්ෂණික නිලධාරියාගෙන් සමන්විත කාර්යය මණ්ඩලයේ සෘජු අධීක්ෂණය යටතේ ඉදිකිරීම් සිදු කළ යුතුය. | ගොඩනැගිලි දෙපාර්තමේන්තුව වෙත පවරා දුන් ප්‍රතිපාදන උපයෝගී කරගෙන අදාළ අලුත්වැඩියා කටයුතු 2018 වර්ෂයේ නිම කර ඇති නමුත් අක්මුදල් ප්‍රමාණවත් නොවීම මත අදාළ වවුචර්පත් සඳහා ගෙවීම් කර නොමැති බැවින් වියදම් වාර්තා නොවීම මත මෙම ඉතිරිවීම සිදුව ඇත. එබැවින් භෞතික ප්‍රගතිය පිළිබඳ දත්ත ඉදිරිපත් කළ නොහැකි බව. |
| (ආ) සමාලෝචිත වර්ෂයේදී දිස්ත්‍රික් ලේකම් කාර්යාල 08 ක් වෙත විවිධ කාර්යයන් 34 ක් වෙනුවෙන් රු.මිලියන 29.23 ක ප්‍රතිපාදන සලසා තිබුණි. 2018 දෙසැම්බර් 31 දින වන විට ඉන් රු.මිලියන 12.54 ක ප්‍රතිපාදන ඉතිරි කර තිබුණි. ඒ අනුව මූල්‍ය ප්‍රගතිය සියයට 57 ක් වී තිබුණි. අදාළ කාර්යයන් පිළිබඳ භෞතික ප්‍රගතිය | දිස්ත්‍රික් ලේකම් කාර්යාලවලින් නිවැරදි ඇස්තමේන්තු ලබා ගෙන ප්‍රතිපාදන සලසා දිය යුතු අතර දිස්ත්‍රික් ලේකම් කාර්යාල විසින් ඉටුකරනු ලබන කාර්යයන් පිළිබඳ පසුවිපරම් කළ යුතුය. | දිස්ත්‍රික් ලේකම් කාර්යාල වෙත පවරන ලද අලුත්වැඩියා කාර්යයන් 2018 වර්ෂයේ ඉටු කර ඇති අතර, අක්මුදල් ප්‍රමාණවත් නොවීම මත දෙසැම්බර් 31 දිනට වියදම් වාර්තා වී නොමැති බව හා අනුරාධපුර දිස්ත්‍රික් ලේකම් |

| | | |
|---|---|---|
| පිළිබඳ තොරතුරු විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. | | කාර්යාලය වෙත පවරා දී ඇත්තේ ප්‍රජා සෞඛ්‍ය ප්‍රවර්ධන සේවයේ නිලධාරීන්ගේ වැටුප් හා වේතන සහ ව්‍යාපෘතියේ අනෙකුත් වියදම් වලට අදාළ ප්‍රතිපාදන බව. |

## 2.5 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් නිකුත් කිරීම් හා අයකර ගැනීම්

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව, 2018 දෙසැම්බර් 31 දිනට ස්ථාන මාරුවී ගිය නිලධාරීන්ගේ ණය ශේෂ හැර අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.මිලියන 1.93 ක් වී තිබුණි. එම හිඟ හිටි ණය ශේෂ වර්ෂ 01 ක සිට වර්ෂ 05 ක් දක්වා කාල පරාසයක සිට පැවැත එමින් තිබුණත්, එම හිඟහිටි ණය ශේෂ අයකර ගැනීමේ පසුවිපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවතුණි. | 2004 ඔක්තෝබර් 11 දිනැති අංක 118 දරන ජාතික අයවැය චක්‍රලේඛය හා ආයතන සංග්‍රහයේ XXIV වන පරිච්ඡේදයේ 4 වගන්තිය ප්‍රකාරව කටයුතු කළ යුතුය. | අදහස් දක්වා නැත. |

## 2.6 තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කිරීම හා පියවීම

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| මුදල් රෙගුලාසි 371(5) ප්‍රකාරව, කිසියම් විශේෂිත කාර්යයක් සඳහා ලබාගත් තත්කාර්ය අතුරු අග්‍රිම එම කාර්යය නිමකර දින 10 ක් ඇතුළත පියවිය යුතු නමුත්, අවස්ථා 32 කදී ලබාගෙන තිබුණු එකතුව රු.මිලියන 1.61 ක තත්කාර්ය අතුරු අග්‍රිම කාර්යය නිමකළ පසු දින 15 ක සිට දින 220 ක් දක්වා පරාසයක කාල ප්‍රමාදයකින් පසුව නිරවුල් කර තිබුණි. | මුදල් රෙගුලාසි 371(5) ප්‍රකාරව කටයුතු කළ යුතුය. | තත්කාර්ය අතුරු අග්‍රිමය වියදම් කර අවසන් වූ විගස ඉතිරිය සරප් වෙත ගෙවීමට කටයුතු කරන අතර පියවීමේ වවුචරයේ සියලු අඩුපාඩු සම්පූර්ණ කර නිවැරදි කරන තුරු ගිණුම් ගත කිරීම නොකරන බැවින් අත්තිකාරම් පියවීමට සැලකිය යුතු කාලයක් ගතවී ඇත. ඉදිරියේ දී |

| | | |
|---|---|---|
| | | නියමිත කාලය තුළ සම්පූර්ණ කරන ලද අත්තිකාරම් පියවීමේ වවුචර ගිණුම් අංශයට ලබා දීමට කටයුතු කරන ලෙස සියලුම ආයතනවලට දැනුම් දී ඇති බව. |

**2.7 අධිභාර කිරීම්**

**-----------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ආයුර්වේද දෙපාර්තමේන්තුව යටතේ ඇති දේශීය වෛද්‍ය ක්‍රම පිළිබඳ ජාතික ආයතනය විසින් පවත්වා තිබුණු පුහුණු පාඨමාලාවලට සහභාගීවූවන්ට ආහාර සැපයීම සඳහා රු.මිලියන 7.03 ක් වැයකර තිබුණි. ආහාර සපයා ගැනීම සඳහා ප්‍රසම්පාදන ක්‍රියාපරිපාටිය අනුගමනය කර නොතිබුණි. එම ආයතනයේ සුභසාධක සංගමය විසින් බාහිර පාර්ශවයන් වෙතින් මිලදී ගෙන සපයන ආහාර වෙනුවෙන් වියදම් කර තිබුණු මුදලට සියයට 10 ක ලාභාන්තිකයක් එකතු කරමින් සුභසාධක සංගමය නමින් ඉදිරිපත් කර තිබුණු බිල්පත් වටිනාකමට දෙපාර්තමේන්තුව විසින් මුදල් ගෙවා තිබුණි. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. | ආහාර සැපයීම සඳහා 02/01/02 – 1 ගොනුවේ සටහන මගින් පෙර ආයුර්වේද කොමසාරිස් අනුමැතිය ලබා දී ඇති අතර ලාභ ලබාගැනීම සම්බන්ධව සුභසාධක සංගමය විසින් ඉදිරිපත් කරන ලද ලිපිය අමුණා ඇති බව. |
| (ආ) | සමාලෝචිත වර්ෂය තුළදී කිසිදු අධිකාරී බලයකින් තොරව, නිදන්ගත වකුගඩු රෝග නිවාරණය සඳහා වූ දේශීය ප්‍රතිකාර ප්‍රවර්ධන වැඩසටහන යටතේ, නිලධාරීන් 05 දෙනෙකු වෙත ප්‍රවාහන දීමනා ලෙස එකතුව රු.67,500 ක්ද, නිලධාරීන් 09 දෙනෙකු වෙත ගිණුම් කටයුතු ඉටුකිරීමේ දීමනා ලෙස එකතුව රු.150,000 ක්ද, | අධිකාරී බලය නොමැතිව සිදුකර තිබුණු දීමනා ගෙවීම් ආපසු අයකර ගත යුතුය. | අදහස් දක්වා නැත. |

| | | | |
|---|---|---|---|
| | නිලධාරීන් 05 දෙනෙකු වෙත මාසික ප්‍රගති සමාලෝචන රැස්වීමට සහභාගීවීමේ දීමනා ලෙස එකතුව රු.14,250 ක්ද ගෙවා තිබුණි. | | |
| (ඇ) | දේශීය වෛද්‍ය ක්‍රම පිළිබඳ ජාතික ආයතන නේවාසිකාගාරයේ පවතින කාමර 24 කින් එක් කාමරයක් 2007 වර්ෂයේ සිට විගණිත දිනය වූ 2018 දෙසැම්බර් 31 දින දක්වා වූ කාලපරිච්ඡේදය තුළ දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ මාධ්‍ය ඒකකයේ නිලධාරීන් දෙදෙනෙකු වෙත පූර්ණකාලීනව නවාතැන් ගැනීම සඳහා ලබාදී තිබුණි. නමුත් එම කාලපරිච්ඡේදය සඳහා රු.803,000 ක ගාස්තු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.<br>2018 සැප්තැම්බර් 27 දින සිට 2018 නොවැම්බර් 27 දින දක්වා වූ මාස දෙකක කාලයක් අමාත්‍යාංශයේ විමර්ශන අංශයේ නිලධාරීන් 4 දෙනෙකු වෙත කාමර දෙකක් නවාතැන් සඳහා ලබාදී තිබුණු නමුත් ඔවුන්ගෙන් එකතුව රු.12,000 ක ගාස්තු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. එසේම නේවාසිකාගාර ගාස්තු තීරණය කළ හා අය කරන පදනම හා ඒ සඳහා වූ අනුමැතිය විගණනයට ඉදිරිපත් නොකළ අතර 2015 වර්ෂයේ සිට ගාස්තු සංශෝධනය කර නොතිබුණි. | නියමිත පරිදි ගාස්තු අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | මේ සම්බන්ධව දේශීය වෛද්‍ය ක්‍රම පිළිබඳ ජාතික ආයතනය විසින් දැනුවත් කර ඇති අතර ඉදිරියේදී මේ පිළිබඳ පියවර ගන්නා බව. |
| (ඈ) | බොරැල්ල ආයුර්වේද ශික්ෂණ රෝහලේ ආපනශාලාව පවත්වා ගෙන යන පුද්ගලයකුගෙන් 2015 ජනවාරි මාසයේ සිට මාසිකව රු.41,000 ක් බැගින් එකතුව රු.මිලියන 1.97 ක් ගාස්තු වශයෙන් අයකර ගෙන තිබුණි. එම ආදායම රාජ්‍ය ආදායමට බැර කිරීමට කටයුතු | රජයේ ගොඩනැගිල්ලක පවත්වනු ලබන ආපනශාලාවෙන් අයකරනු ලබන කුලිය රාජ්‍ය ආදායමට බැර කළ යුතුය. ආපනශාලාකරු විසින් ලබාදී තිබුණු කුලිය සුභසාධක සංගමයෙන් ලබා ගෙන රාජ්‍ය ආදායමට බැර | ආපනශාලාව පවත්වාගෙන යාම සම්බන්ධයෙන් රජයට අයවිය යුතු ජලය, විදුලිය, බිම් කුලිය අය කර ගැනීමට අවශ්‍ය පියවර ගන්නා මෙන් දන්වා 2014 දෙසැම්බර් 21 දිනැතිව ආයුර්වේද |

| | | |
|---|---|---|
| නොකර රෝහලේ ක්‍රීඩා හා සුහසාධක සංගමය වෙත ලබාදීමට කටයුතු කර තිබුණි. | කිරීමට කටයුතු කළ යුතුය. | කොමසාරිස් වෙත ලිපියක් ඉදිරිපත් කර ඇත. එකල සිටි කොමසාරිස්වරු විසින් මේ සම්බන්ධව නිසි ක්‍රියාමාර්ග ගෙන නොමැති අතර මේ සම්බන්ධව සොයා බලා කටයුතු කිරීමට සටහන් කර ගත් බව. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

---------------------------

**3.1 සැලසුම් කිරීම**

----------------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ සඳහන් විධිවිධානවලට අනුව 2018 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කළ යුතුව තිබුණත්, ඒ වෙනුවට පිළියෙල කර තිබුණු ක්‍රියාකාරී සැලැස්ම සම්බන්ධයෙන් පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය. | | |
| (අ) සමාලෝචිත වර්ෂයට අදාළ වාර්ෂික අයවැය පදනම් කර ගත් ප්‍රමුඛතා අනුව නිසි පරිදි පිළියෙල කළ ක්‍රියාකාරකම් සැලැස්ම (Activity Plan), ක්‍රියාත්මක කාල රාමුව (Time Line) හා එම ක්‍රියාකාරකම්වල අපේක්ෂිත නිමවුම හෝ ප්‍රතිඵල (Output/ Outcome) ඇතුළත් වන පරිදි ක්‍රියාකාරී සැලැස්ම (Action Plan) පිළියෙල කර නොතිබුණි. | රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. | 2018 අවසන් කාර්තුව දක්වා අනු ආයතන වල තොරතුරු රැස් කළ ද නිවැරදි තොරතුරු ලැබීම ප්‍රමාද වීම මත ක්‍රියාකාරී සැලැස්ම නැවත සංශෝධනය කිරීමට සිදු විය. 2019 ක්‍රියාකාරී සැලැස්ම නිවැරදි කාල රාමු සහිතව සකස් කරමින් පවතී. එය කඩිනමින් ලබා දීමට කටයුතු කරන බව. |
| (ආ) දෙපාර්තමේන්තුව යටතේ ඇති එක් එක් අංශ, උප ආයතන, රෝහල් හා ඔසු උයන්වල අවශ්‍යතා පදනම් කරගත් ක්‍රියාකාරකම් නිවැරදිව හඳුනාගත හැකි පරිදි ක්‍රියාකාරී | රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. | අදාළ තොරතුරු 2019 ක්‍රියාකාරී සැලැස්ම සමඟ ඉදිරිපත් කරන ප්‍රසම්පාදන සැලැස්මෙහි ඇතුළත් කර ඇති බව. |

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | සැලැස්ම පිළියෙල කර නොතිබුණි. තවද ආයුර්වේද රෝහල් සඳහා අමු හා වියලි ඖෂධ මිලදී ගැනීමේ ක්‍රියාකාරකම එහි ඇතුළත් කර නොතිබුණි. | | |
| (ඇ) | ප්‍රදේශයේ කාලගුණය, දේශගුණය හා ඔසු වගාවට අදාළ අනෙකුත් සාධක පිළිබඳ වෙන් වෙන්ව අවධානය යොමු කර ඒ ඒ ඔසු උයන සඳහා නිශ්චිත ක්‍රියාකාරකම් හඳුනාගෙන ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර නොතිබුණි. | රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. | 2018 වර්ෂයේදී පොදු ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර ඇති නමුත් 2019 වර්ෂයේදී එක් එක් ඔසු උයනට අදාළව වෙනම සංවර්ධන සැලැස්මක් පිළියෙල කර ඇති බව. |
| (ඈ) | ඖෂධ නිෂ්පාදනය සඳහා දේශීය සැපයුම්කරුවන්ගෙන් අමු හා වියළි ඖෂධ මිලදී ගැනීමට සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 33.86 ක් වැය කර තිබුණු අතර, දෙපාර්තමේන්තු ඔසු උයන්වලින් එම අවශ්‍යතාවය සම්පාදනය කර ගැනීමේ විධිමත් හා ක්‍රමවත් වැඩපිළිවෙලක් හඳුනාගෙන ක්‍රියාත්මක කර නොතිබුණි. | අමු හා වියළි ඖෂධ අවශ්‍යතාව දෙපාර්තමේන්තු ඔසු උයන්වලින් සම්පාදනය කර ගැනීමේ විධිමත් හා ක්‍රමවත් වැඩපිළිවෙලක් හඳුනාගෙන ක්‍රියාත්මක කළ යුතුය. | ඔසු උයන්වල ඇති විශාල ශාක ඉවත් කර ගොවිපළක් ලෙස සංවර්ධනය කිරීමේ හැකියාවක් නොමැති බව හා ඔසු උයන සඳහා සකස් කර ඇති සංවර්ධන සැලැස්ම භාවිතයෙන් හැකි උපරිම ඵලදාවක් ලබා ගැනීමට කටයුතු කරනු ලබන බව. |
| (ඉ) | ඔසු උයන් 6 ක වගාවන් සිදුකර ඇති අක්කර 223 ක් වූ භූමි ප්‍රමාණයේ කෙටිකාලීන ඖෂධීය ශාක යටි වගාවක් ලෙස ආරම්භ කිරීමට ඇති හැකියාවන් පිළිබඳ සොයා බැලීමට දෙපාර්තමේන්තුවේ අවධානය යොමු වී නොතිබුණි. | කෙටිකාලීන යටි වගාවන් ආරම්භ කිරීමට ඇති හැකියාවන් පිළිබඳ සොයා බැලීමට කටයුතු කළ යුතුය. | මේ පිළිබඳව අවධානය මේ වන විට යොමු වී ඇති අතර ඒ අනුව එක් එක් ඔසු උයන සඳහා සකස් කර ඇති සංවර්ධන සැලැස්ම භාවිතයෙන් හැකි උපරිම ඵලදාවක් ලබා ගැනීමට කටයුතු කරන බව. |

## 3.2 කාර්යභාරයන් පිළිබඳ ප්‍රගතිය සමාලෝචනය කර නොතිබීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | දෙපාර්තමේන්තුව යටතේ ඇති සියළුම අංශවල, උප ආයතනවල, රෝහල් හා ඔසු | අදාළ ක්‍රියාකාරකම්වල ප්‍රගතිය ඇගයීම සඳහා කාර්යසාධන දර්ශක | අදාළ කාර්ය දර්ශක පිහිටුවීම සඳහා මේ වන විට කමිටුවක් පත් කර |

| | | | |
|---|---|---|---|
| | උයන්වලට අදාළ ක්‍රියාකාරකම්වල ප්‍රගතිය ඇගයීම සඳහා කාර්යසාධන දර්ශක ගොඩනගා නොතිබුණු අතර ක්‍රියාකාරකම්වල ප්‍රගති සමාලෝචනය කර නොතිබුණි. | ගොඩනගා ක්‍රියාකාරකම්වල ප්‍රගතිය සමාලෝචනය කළ යුතුය. | ඇති අතර එහි වාර්තාව හැකි ඉක්මණින් ලබාගෙන කටයුතු කිරීමට සටහන් කරගත් බව. |
| (ආ) | සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු ක්‍රියාකාරී සැලැස්මට (Action Plan) අදාළව ප්‍රගති සමාලෝචන වාර්තා 2019 අප්‍රේල් 30 දින වන විටත් පිළියෙල කර නොතිබුණි. ඒ හේතුවෙන් කාර්යභාරයන් ඉටු නොකිරීම්, ප්‍රධාන කාර්යයන්ට පටහැනි ක්‍රියාකාරකම්, අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනිම, අපේක්ෂිත ප්‍රතිලාභ (Outcome) ලබා නොගැනීම, ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම්, ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන් හා කාල පමාවකින් පසුව වැඩ ආරම්භ කළ ව්‍යාපෘති පිළිබඳ පරීක්ෂා කළ නොහැකි විය. | ක්‍රියාකාරී සැලැස්මේ ප්‍රගතිය මාසිකව යාවත්කාලීන වන පරිදි ක්‍රමවේදයක් ස්ථාපිතකර ක්‍රියාකාරී සැලැස්මේ ප්‍රගතිය අධීක්ෂණය කරමින් අපේක්ෂිත ප්‍රතිලාභ සමාලෝචිත වර්ෂය තුළදී අත්පත්කර ගැනීමට කටයුතු කළ යුතුය. | මානව සම්පත් හිග අතර මෙම විෂයට නවක සංවර්ධන නිලධාරීන් පුහුණු කරමින් පවතී. සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු ක්‍රියාකාරී සැලස්මට අදාළ ප්‍රගති සමාලෝචන වාර්තා ජුනි මස 10 දිනට පෙර විගණනයට යොමු කරන බව. |

**3.3 වාර්ෂික කාර්යසාධන වාර්තාව**

----------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2002 සැප්තැම්බර් 12 දිනැති අංක 402 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව, මුදල් වර්ෂය අවසාන වී දින 150 ක් ඇතුළත සමාලෝචිත වර්ෂයට අදාළ කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත්, 2017 හා 2018 වර්ෂවල කාර්යසාධන වාර්තා 2019 අප්‍රේල් 30 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි. | රාජ්‍ය මුදල් චක්‍රලේඛය හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(2) වගන්තිය ප්‍රකාරව කටයුතු කළ යුතුය. | 2017 කාර්යසාධන වාර්තාව සභාගත කිරීම සඳහා 2019/5/22 දින යවා ඇති බව. |
| (ආ) | සමාලෝචිත වර්ෂය සඳහා ඉදිරිපත් කරන ලද කාර්යසාධන වාර්තාවට දෙපාර්තමේන්තුවේ ආයතන හා පාලන අංශයේ | ඒ ඒ අංශයට නියමිත කාර්යයභාරය ඇඟයීමකට ලක්කළ හැකි පරිදි කාර්යසාධන වාර්තා | අදහස් දක්වා නැත. |

| | | | |
|---|---|---|---|
| | කාර්යයන් 04 ක ප්‍රගතිය පමණක් ඇතුළත් කර තිබුණි. කාර්යයන් 06 ක ප්‍රගතිය පිළිබඳ තොරතුරු ඉදිරිපත් කර නොතිබුණි. එමෙන්ම අංශ 4 ක් වෙත වර්ෂයේ ආරම්භයේදී ඉටුකළ යුතු කාර්යයන් ප්‍රමාණය, වර්ෂය තුළ ඉටු කළ ප්‍රමාණය හා වර්ෂය අවසානයට ඉටුකළ යුතු ප්‍රමාණය පිළිබඳ තොරතුරු සඳහන් කර නොතිබුණි. | ඉදිරිපත් කළ යුතුය. | |
| (ඇ) | ඉදිරිකිරීම් කාර්යයන් පිළිබඳ තොරතුරු අවිච්ඡේද, නව හා අත්හළ ව්‍යාපෘති ලෙස වර්ග කර අනාවරණය කර නොතිබුණි. | ඉදිකිරීම් සම්බන්ධ සියළු තොරතුරු වාර්තා කිරීමට කටයුතු කළ යුතුය. | අදහස් දක්වා නැත. |

**3.4 ප්‍රසම්පාදනයන්**

**------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|---|
| | **------------------------** | **--------------** | **-----------------------** |
| (අ) | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 මාර්ගෝපදේශය ප්‍රකාරව, ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. | 2020 වර්ෂයේ සිට පිළියෙල කිරීමට අපේක්ෂා කරන බව. |
| (ආ) | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.2 මාර්ගෝපදේශය ප්‍රකාරව, පිළියෙල කර තිබුණු ප්‍රසම්පාදන කාල සටහනේ එක් එක් ප්‍රසම්පාදන කාර්යය නිශ්චිතව හඳුනාගෙන නොතිබුණු අතර ප්‍රසම්පාදනයන්ගේ ප්‍රගතිය පිළිබඳ වාර්තා විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. | 2018 වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්ම (කාල රාමුවද ඇතුළත්ව) පිළිතුරට අමුණා ඇති බව. |
| (ඇ) | සමාලෝචිත වර්ෂය වෙනුවෙන් පිළියෙල කර තිබුණු ප්‍රසම්පාදන සැලැස්මට ආයුර්වේද රෝහල් සඳහා මිලදී ගනු ලබන අමු හා වියලි ඖෂධ | ප්‍රසම්පාදන ක්‍රියාවලියට අයත් සියළු විෂයයන් ඇතුළත් වන පරිදි ප්‍රසම්පාදන සැලැස්ම | අමු හා වියලි ඖෂධ මිලදී ගැනීම් 1204 වෛද්‍ය සැපයුම් වැය විෂයටම ඇතුළත් |

| | | | |
|---|---|---|---|
| | මිලදී ගැනීම් සහ ඔසු උයන්වල සැලසුම් කරන ලද ඉදිකිරීම් ඇතුළත් කර නොතිබුණි. | පිළියෙල කළ යුතුය. | බව. |
| (ඈ) | සම්ප්‍රදායික වෛද්‍ය ක්‍රම හා අනුපූරක ඖෂධ පිළිබඳ අන්තර් ජාතික සම්මන්ත්‍රණය හා වෙළඳ ප්‍රදර්ශනය (Trad Med International Symposium Exhibition) වෙනුවෙන් ඉකුත් වර්ෂයේදී රු.මිලියන 39.41 ක් හා සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 8.40 ක් වැයකර තිබුණි. ඉන් රු.මිලියන 46.42 කට අදාළ ප්‍රසම්පාදනයන් සම්බන්ධයෙන් ලංසු ලියවිලි (Bid Document), කොන්ත්‍රාත් කොන්දේසි (conditions of contract), නිකුත් කළ ලංසු ප්‍රමාණය, ලැබුණු ලංසු, ලංසු විවෘත කිරීමේ වාර්තා, තාක්ෂණ ඇගැයීම් කමිටු හා ප්‍රසම්පාදන කමිටු වාර්තා, කොන්ත්‍රාත් වටිනාකම්, සැපයුම්කරුවන් සමඟ එළැඹි ගිවිසුම්, ලංසු සුරක්ෂණ හා කාර්යසාධන සුරක්ෂණ ආදිය විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. තවද මෙම අන්තර්ජාතික සම්මන්ත්‍රණය හා වෙළඳ ප්‍රදර්ශනයේ සමස්ථ වියදම පිළිබඳ තොරතුරු හා අපේක්ෂිත ප්‍රතිලාභ අත්කර ගත් බවට තොරතුරු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. විගණනය සඳහා අවශ්‍ය තොරතුරු නොපමාව ඉදිරිපත් කළ යුතුය. | මෙම ප්‍රදර්ශනයේ අත්පත් කර ගත් ප්‍රතිලාභ 2017 කාර්යසාධන වාර්තාවේ සඳහන් වේ. තවද මේ සම්බන්ධ ගොනු සියල්ල විගණනය සඳහා ඉදිරිපත් කර ඇති බව. |
| (ඉ) | නාවින්න බණ්ඩාරනායක ආයුර්වේද පර්යේෂණ රෝහලේ ස්ත්‍රී රෝග වාට්ටුව සඳහා මුළු පිරිවැය රු.මිලියන 14.9 ක් වූ 4D volume Probe පහසුකම් සහිත high end color Doppler ultra sound scanner යන්ත්‍රයක් මිලදී ගැනීම සම්බන්ධයෙන් පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.<br>(i) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.14.1 මාර්ගෝපදේශය ප්‍රකාරව, රු.මිලියන 10 කට අඩු ප්‍රසම්පාදන් සම්බන්ධයෙන් දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවකට කටයුතු කළ හැකි වුවත්, එම මුල්‍ය සීමාව ඉක්මවා මුළු පිරිවැය රු.මිලියන 14.9 ක් වූ ප්‍රසම්පාදනය මිල සැඳහුම් ක්‍රමය අනුගමනය කරමින් දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. | වෙළඳපොළ මිල සැඳැහුම් ක්‍රමය මත ලංසු කැඳවා නැත. |

කමිටුව විසින් සිදුකර තිබුණි.

(ii) ආයතන 12 කින් ලංසු කැඳවා තිබුණද, ආයතන 2 කින් පමණක් ලංසු ඉදිරිපත් කර තිබුණි. ඉන් එක් ආයතනයකින් පමණක් 4D volume Probe පහසුකම සහිතව ලංසු ඉදිරිපත් කර තිබුණි. පිරිවිතරවලට අනුව තීරණාත්මක සාධකයක් වූ 4D volume Probe පහසුකම් සැපයීමට එක් ලංසුවක් පමණක් ඉදිරිපත්වී තිබුණි. මේ නිසා ප්‍රසම්පාදනය විනිවිදභාවයකින් හා තරඟකාරී ලෙස ඉටුකිරීමට නොහැකිවී තිබුණි.

(iii) මෙම ස්කෑන් යන්ත්‍රය ඉල්ලුම් කළ වෛද්‍යවරිය වෙතින් 4D volume Probe පහසුකම අත්‍යාවශ්‍ය බවට 2017 දෙසැම්බර් 11 දින ලිපියක් ලබාගෙන එම යන්ත්‍රය මිලදී ගැනීමට ප්‍රසම්පාදන කමිටුව තීරණය කර තිබුණි.

(iv) බටහිර ක්‍රමයට ස්ත්‍රී රෝග සඳහා ප්‍රතිකාර කරන ප්‍රමුඛතම රෝහලක් වන කාසල් වීදියේ කාන්තා රෝහල තුළද මෙවැනි ඉහළ මට්ටමේ තාක්ෂණික පහසුකම් හා ධාරිතා මට්ටමකින් යුක්ත ස්කෑන් යන්ත්‍රයක් නොතිබුණි. එම ඉල්ලීම කළ වෛද්‍ය නිලධාරිනිය විශේෂඥ වෛද්‍යවරියක් වී නොතිබුණි. ඇය විසින් සිදු කරන ලද හෝ සිදු කිරීමට යෝජිත රෝග පිළිබඳ පරීක්ෂණවලට මෙම යන්ත්‍රයේ අවශ්‍යතා හා යන්ත්‍රය ක්‍රියාත්මක කර අවශ්‍ය ප්‍රතිඵල ලබා ගැනීමට හැකියාවක් ඇති වෛද්‍ය නිලධාරීන් පිළිබඳ තොරතුරු සොයාබැලීමකින් තොරව මෙම යන්ත්‍රය මිලදී ගෙන තිබුණි.

(v) පිරිවිතර සමඟ සපයා ඇති යන්ත්‍රය ගැලපෙන බව සනාථකර ගැනීමකින් තොරව යන්ත්‍රය භාර ගෙන තිබුණු අතර යන්ත්‍රය ක්‍රියාකිරීම පිළිබඳ පුහුණුවීම් ලබා

ගෙන නොතිබුණි.

(vi) සපයා ගෙන තිබුණු ස්කෑන් යන්ත්‍රයට නිවැරදි 4D volume Probe පරිගණක මෘදුකාංගය යොදා නොතිබුණු බවත්, පද්ධතියේ දුර්වලතා පවතින බවත් හා ප්‍රින්ටරය සුදුසු පරිදි ක්‍රියාත්මක නොවන බවත්, පසුව සිදුකර තිබුණු පරීක්ෂණයකදී අනාවරණය වී තිබුණි.

(vii) මෙම යන්ත්‍රය ඉල්ලුම් කරන ලද වෛද්‍යවරියගේ දැනුම මත පමණක් පදනම්ව 2018 සැප්තැම්බර් 18 දින සිට මෙම යන්ත්‍රය ක්‍රියාත්මක කර තිබුණු නමුත් ස්කෑන් යන්ත්‍රයෙන් වෛද්‍යවරිය අපේක්ෂා කළ හා අත්‍යාවශ්‍ය ලෙස සලකන බව සඳහන් කළ 4D Probe පහසුකම නොමැති බව හඳුනාගැනීමට එම වෛද්‍යවරිය අපොහොසත් වී තිබුණි.

**3.5 වත්කම් කළමනාකරණය**

-----------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2000 වර්ෂයේදී ආයුර්වේද පර්යේෂණායතනයට මිලදී ගෙන තිබුණු පිරිවැය රු.මිලියන 14.60 ක් වූ GCMS යන්ත්‍රය 2012 දෙසැම්බර් මාසයේ සිට 2018 අගෝස්තු මාසය දක්වා වූ වර්ෂ 06 කට ආසන්න කාල පරිච්ඡේදය තුළ අවස්ථා 09 කදී පමණක් පරීක්ෂණ සඳහා පාවිච්චි කර තිබුණි. | යන්ත්‍ර මිලදී ගැනීමට පෙර අවශ්‍යතාවය නිසි පරිදි හඳුනාගත යුතු අතර ඊට අනුකූල නොවන නිලධාරීන්ගේ තීරණ මත රජයට සිදුවන පාඩුව සම්බන්ධයෙන් 1993 ජූලි 21 දිනැති අංක 320 දරන භාණ්ඩාගාර චක්‍රලේඛ ලිපියේ සඳහන් විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. | දැනට පර්යේෂණ කටයුතු සඳහා යොදා ගනිමින් පවතින බව. |
| (ආ) | ආයුර්වේද පර්යේෂණායතනය සතු පිරිවැය රු.මිලියන 3.21 ක් වූ ඩෙන්සිටනෝ මීටරය හා එයට සම්බන්ධ පරිගණකය අක්‍රීය වී තිබුණද, එය අළුත්වැඩියා කර භාවිතයට ගැනීමට හෝ විධිමත් පරිදි අපහරණය කිරීමට හෝ කටයුතු කර නොතිබුණි. 2018 දෙසැම්බර් 31 දින වන විටත් වර්ෂ 08 කට වැඩි කාලයක් පර්යේෂණායතනය තුළ තබා තිබුණි. | අළුත්වැඩියා කර භාවිතයට ගැනීමට හෝ විධිමත් පරිදි අපහරණය කිරීමට හෝ කටයුතු කළ යුතුය. | මෙම ඩෙන්සිටනෝ මීටරය අපහරනය සඳහා නිර්දේශ වී ඇති අතර ආයතන කිහිපයකින්ම මෙම ඩෙන්සිටනෝ මීටරයේ අවශ්‍යතාවය ගැන විමසා ඇත. නමුත් කිසිදු ආයතනයකින් අවශ්‍ය බව දන්වා නැත. එබැවින් මෙම ඩෙන්සිටනෝ මීටරයට කුමක් කරන්නේද යන්න අමාත්‍යාංශයෙන් විමසා ඉදිරි කටයුතු කරන බව. |

**3.6 රජයේ නිලධාරීන් ඇප තැබීම**

--------------------------------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මුදල් රෙගුලාසි 880 හි සඳහන් විධිවිධාන ප්‍රකාරව, ඇප තැබිය යුතු නිලධාරීන් විසින් ඇප තබා ඇති බව | මුදල් රෙගුලාසි විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. | මුදල් රෙගුලාසි 880 හා 891 හි සඳහන් විධිවිධාන ප්‍රකාරව කටයුතු කිරීමට |

| | | |
|---|---|---|
| තහවුරු නොකෙරුණු අතර මුදල් රෙගුලාසි 891 හි සඳහන් විධිවිධාන ප්‍රකාරව, ඇප අවශ්‍ය සියළුම නිලධාරීන්ගේ නම් ඇතුළත් ඇප ලේඛනයක් පවත්වා නොතිබුණි. | | දැනුවත් කර ඇති බව. |

## 3.7 පාඩු හා හානි

-------------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| දෙපාර්තමේන්තුව සතු මෝටර් රථයක් 2016 වර්ෂයේදී අනතුරකට ලක්වීමෙන් සිදුවී තිබුණු අලාභය රු.158,100 ක් වූ අතර එය වගකිව යුතු පාර්ශවයන්ගෙන් අයකර ගැනීමට 2019 අප්‍රේල් 30 දින වන විටත් කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර අලාභය වගකිවයුතු නිලධාරීන්ගෙන් අයකර ගැනීමට හෝ පොත්වලින් කපා හැරීමට කටයුතු කළ යුතුය. | අදහස් දක්වා නැත. |

## 3.8 කළමනාකරණ දුර්වලතා

---------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ .

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) බණ්ඩාරනායක අනුස්මරණ ආයුර්වේද පර්යේෂණායතනයේ බෝ නොවන රෝග සඳහා ප්‍රතිකාර කළමනාකරණ පද්ධතිය පිළිබඳ පර්යේෂණ වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘති කාර්යයන් සඳහා ඍජුවම දායක කර ගතයුතු නිලධාරීන් 63 ක පුරප්පාඩු පැවති තත්ත්වයක් යටතේ හා අවශ්‍ය විද්‍යාගාර පහසුකම් සම්පූර්ණ නොකර 2013 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා කාලය තුළ එකතුව රු.මිලියන 164.96 ක් පිරිවැය වූ පර්යේෂණ උපකරණ මිලදීගෙන තිබුණි. එම උපකරණ නිෂ්කාර්යව තිබියදී, 2016 වර්ෂයේදීද පිරිවැය රු.මිලියන 38.04 ක් වූ පර්යේෂණ උපකරණ මිලදීගෙන තිබුණි. 2019 අප්‍රේල් 30 දින වන විට එම උපකරණවලින් පිරිවැය රු.මිලියන 65.06 ක් වූ | මිලදී ගෙන තිබුණු උපකරණ භාවිතයට ගෙන අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීමට කටයුතු කළ යුතුය. | කාර්යය මණ්ඩලය බඳවා ගැනීමට සහ අවබෝධතා ගිවිසුම සකස් කිරීමට කටයුතු කරන බව. |

| | | | |
|---|---|---|---|
| | උපකරණ භාවිතයට නොගෙන නිෂ්කාර්යව පැවති අතර පිරිවැය රු.මිලියන 137.94 ක් වූ උපකරණ ඌන උපයෝජිතව පැවතුණි. | | |
| (ආ) | පාරම්පරික දැනුම සංරක්ෂණය හා දේශීය වෙදකම ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් දිවයින පුරා සිටින සෑම පාරම්පරික වෛද්‍යවරයෙකුම සතු දැනුම සංරක්ෂණය කිරීමට හා ඒ සඳහා ශ්‍රව්‍ය දෘශ්‍ය තොරතුරු විශ්ව කේන්ද්‍රයක් ස්ථාපිත කිරීමට තීරණය කරමින්, රු.මිලියන 23.55 ක් වැයකර එම ඒකකයට අවශ්‍ය උපකරණ මිලදී ගෙන තිබුණි. නමුත් එම ඒකකයේ කටයුතු කරගෙන යාමට සෘජුවම අවශ්‍ය ශ්‍රව්‍ය දෘශ්‍ය ඒකකය භාර නිලධාරි, වැඩ සටහන් නිෂ්පාදක, තාක්ෂණ නිලධාරී, වීඩියෝ සංස්කාරක, ශබ්ද සංස්කාරක හා සහායක, පරිගණක ක්‍රියාකරු යන තනතුරු 07 ක් සහ කැමරා ශිල්පී තනතුරු 03 ක් 2018 වර්ෂය අවසාන වන විටත් අනුමත කරවා බඳවාගෙන නොතිබුණු බැවින් අදාළ උපකරණ නිශ්කාර්යව පැවතුණි. | කඩිනමින් අදාළ නිලධාරීන් බඳවා ගෙන ව්‍යාපෘති අරමුණු ඉටුකර ගැනීමට කටයුතු කළ යුතුය. | ස්ථිර කාර්යය මණ්ඩලය බඳවා ගැනීමට කටයුතු කරමින් පවතින බව හා එතෙක් අවශ්‍යතාවය පරිදි නිලධාරීන් ලබාදී ඇති බව. |
| (ඇ) | පළමු අදියරය යටතේ රු.මිලියන 39.94 ක් වැයකර මිහින්තලේ ඉලුප්පුකන්නි ප්‍රදේශයේ ඉදිකර තිබුණු මෛත්‍රීපාල සේනානායක අනුස්මරණ පාරම්පරික පර්යේෂණ රෝහල හා කෞතුකාගාරය සඳහා වූ ගොඩනැගිල්ල දෙපාර්තමේන්තුව වෙත 2017 මාර්තු 31 දින භාරදී තිබුණි. 2019 අප්‍රේල් 30 දින වන විටත් සැලසුම්කර තිබුණු අරමුණු වෙනුවෙන් එම ගොඩනැගිල්ල භාවිත කර නොතිබුණි. | සැලසුම්කර තිබුණු අරමුණු වෙනුවෙන් රෝහල භාවිතා කළ යුතුය. | වාර්ෂික ස්ථාන මාරු යටතේ මේ සඳහා නිලධාරීන් ලබාගෙන ඇත. ස්ථාන මාරු ක්‍රියාත්මක වන දිනය 2019.06.03 දින වන අතර ඒ අනුව මෙම රෝහල ඉක්මනින් ආරම්භ කිරීමට නියමිත බව. |
| (ඈ) | 1961 අංක 31 දරන ආයුර්වේද පනතේ 77 වගන්තිය ප්‍රකාරව, ආයුර්වේද වෛද්‍ය කර්මයේ හා ශල්‍ය වෛද්‍ය විද්‍යාවේ කාර්යයන් සඳහා යම් භාණ්ඩයක්, ද්‍රව්‍යයක් හෝ ඖෂධයක් නිෂ්පාදනය කිරීම, | ආයුර්වේද පනත ප්‍රකාරව ආයුර්වේද නීති සංග්‍රහය පිළියෙල කර ප්‍රකාශයට පත්කළ යුතුය. | 2018 වර්ෂයේදී පත්කළ නව කමිටුව කෙටුම්පත් කළ නීති සංග්‍රහය විශේෂඥ කමිටුවක් මගින් සමාලෝචනය කරමින් පවතින බව. |

| | | | |
|---|---|---|---|
| | විකිණීම, සැපයීම, බෙදා හැරීම හෝ පිළියෙල කිරීම තහනම් කිරීමට, විධිමත් කිරීමට හෝ පාලනය කිරීමට අවශ්‍ය යැයි නියෝග පැනවීමට ආයුර්වේද කොමසාරිස්වරයා විසින් පනත යටතේ නියෝග පැනවිය හැකි නීති සංග්‍රහයක් පිළියෙල කළ යුතුවේ. 2017 හා 2018 වර්ෂවලදී මේ සම්බන්ධයෙන් රු.564,580 ක් වැයකර තිබුණද 2019 අප්‍රේල් 30 දින වන විටත් එම නීති සංග්‍රහය පිළියෙල කර නොතිබුණි. | | |
| (ඉ) | 1961 අංක 31 දරන ආයුර්වේද පනතේ 7 වන වගන්තියේ දක්වා ඇති පරමාර්ථ ඉෂ්ඨ කිරීම සඳහා පනතේ 08 වන වගන්තිය මගින් ආයුර්වේද කොමසාරිස්වරයාට ආයුර්වේද ආරෝග්‍යශාලා හා ඊට අනුබද්ධ ආයතන පිහිටුවා පවත්වාගෙන යාමට බලතල පවරා තිබුණි. නමුත් පළාත් සභා හා පළාත් පාලන ආයතන සහ රජය විසින් ස්ථාපිත කරන ලද ආයුර්වේද ආරෝග්‍යශාලා හා ඊට අනුබද්ධ ආයතනවල පිහිටීම සලකා බලා නව ආරෝග්‍යශාලා හා ඊට අනුබද්ධ ආයතන පිහිටුවීමට වඩාත් සුදුසු ප්‍රදේශයන් හඳුනාගැනීමට හා සැලැසුම් පිළියෙල කිරීමට කටයුතු කර නොතිබුණි. | නිසි අධ්‍යයනකින් පසු ආයුර්වේද ආරෝග්‍යශාලා හා ඊට අනුබද්ධිත ආයතන පිහිටුවීමේ සැලැස්මක් පිළියෙල කර ක්‍රියාත්මක කළ යුතුය. | නිසි අධ්‍යයනයකින් පසුව සැලසුම් සහගතව මෙම ඉදිකිරීම් සිදු කිරීමට අවශ්‍ය පියවර ගන්නා බව. |
| (ඊ) | 1961 අංක 31 දරන ආයුර්වේද පනතේ 10 වන වගන්තිය ප්‍රකාරව, ආයුර්වේද දෙපාර්තමේන්තුව, පළාත් සභා හා පළාත් පාලන ආයතන වශයෙන් වූ රාජ්‍ය ආයතන යටතේ පවත්වාගෙන යනු ලබන ආයුර්වේද රෝහල්, ආයුර්වේද මධ්‍යම බෙහෙත් ශාලා හා ආයුර්වේද ඖෂධ නිෂ්පාදනාගාර ලියාපදිංචි කළ යුතුව තිබුණි. ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව, කොළඹ හා මහනුවර මහ නගර සභා දෙක හා ගාල්ල පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුව යන ආයතන හතර තුළ ස්ථාපිත නිෂ්පාදනාගාර 4 හැර වෙනත් කිසිම ආයුර්වේද රෝහලක්, ආයුර්වේද | 1961 අංක 31 දරන ආයුර්වේද පනතේ 10 වන වගන්තිය ප්‍රකාරව පෞද්ගලික හා රජයේ සියළුම ආයුර්වේද ආයතන හා නිෂ්පාදනාගාර නියාමනය කළ යුතුය. | අදහස් ඉදිරිපත් කර නොතිබුණි. |

| | | | |
|---|---|---|---|
| | මධ්‍යම බෙහෙත් ශාලාවක් හා ආයුර්වේද ඖෂධ නිෂ්පාදනාගාරයක් ලියාපදිංචි කර නොතිබුණි. ඒ සම්බන්ධයෙන් සොයා බලා එම ආයතන ලියාපදිංචි කරවා ගැනීමට කටයුතු කර නොතිබුණි. | | |
| (උ) | ආයුර්වේද දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කර ඇති පෞද්ගලික ආයුර්වේද ප්‍රතිකාර මධ්‍යස්ථාන, පෞද්ගලික පංචකර්ම ආයතන, පෞද්ගලික ආයුර්වේද රෝහල්, පෞද්ගලික නිෂ්පාදනාගාර හා පෞද්ගලික වෙළඳසැල් සම්බන්ධයෙන් හා ආනයනික හා දේශීය ඖෂධ සඳහා නව ලියාපදිංචි කිරීම් හා ඒවා අළුත් කිරීම් සම්බන්ධයෙන් පරිගණක දත්ත පද්ධතියක් ස්ථාපිත කර පවත්වා ගැනීමට 2019 අප්‍රේල් 30 දින වන විටත් කටයුතු කර නොතිබුණි. | ශිල්පීය අංශයේ ලියාපදිංචි කිරීම්, බලපත්‍ර නිකුත් කිරීම් යනාදී කාර්යයන්ට අදාළ සියළු තොරතුරු ඇතුළත් වන පරිදි මනා අභ්‍යන්තර පාලනයකින් යුක්ත පරිගණක පද්ධතියක් ස්ථාපිතකර පවත්වා ගැනීමට කටයුතු කළ යුතුය. | පරිගණක දත්ත පද්ධතිය යාවත්කාලීන කර විධිමත් කිරීමට ඉදිරියේදී කටයුතු කරන බව. |
| (ඌ) | ආනයනික ඖෂධ වර්ග 886 ක් සඳහා ආනයන බලපත්‍රද, දේශීය ඖෂධ වර්ග 892 ක් මෙරට නිෂ්පාදනය කිරීම සඳහා බලපත්‍රද, 2018 දෙසැම්බර් 31 දින වන විට දෙපාර්තමේන්තුව විසින් නිකුත් කර තිබුණි.මේ සම්බන්ධයෙන් පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.<br><br>(i) බලපත්‍ර නිකුත්කර තිබුණු ඖෂධ වර්ග ඖෂධ නාමය සහිතව ලේඛනගත කර නොතිබුණි.<br><br>(ii) සූත්‍ර කමිටු අනුමැතියකින් තොරව ඖෂධ ආනයනික බලපත්‍ර නිකුත් කර තිබුණු අවස්ථා විය. එසේම තීරුබදු සහිත ආනයනික ඖෂධ බාණ්ඩ යටතේ වැටෙන ආනයනික ඖෂධ වර්ග, තීරු බදු රහිත බාණ්ඩ යටතේ වර්ග කර බලපත්‍ර නිකුත් කර තිබුණු අවස්ථා විය. | ඖෂධ වර්ග ඖෂධ බාණ්ඩය යටතේ ලියාපදිංචි කිරීමටත්, සූත්‍ර කමිටු අනුමැතියකින් තොරව ඖෂධ ආනයන බලපත්‍ර නිකුත් කිරීම පිළිබඳව පරීක්ෂණ පවත්වා අදාළ නිලධාරීන්ට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගැනීමටත්, බලපත්‍ර නිකුත් කිරීමට අදාළ අභ්‍යන්තර පාලනය ශක්තිමත් කිරීමටත් පියවර ගත යුතුය. | අදහස් දක්වා නැත. |
| | (iii) ආනයනික හා දේශීය ඖෂධ වර්ග සඳහා බලපත්‍ර නිකුත් කිරීමට පෙර සිදුකළ යුතු තාක්ෂණික පරීක්ෂාවන් | දෙපාර්තමේන්තුව විසින් සාම්පල් ලබා ගෙන පිළිගත් ආයතනයකින් | අදහස් දක්වා නැත. |

| | | | |
|---|---|---|---|
| | දෙපාර්තමේන්තුව විසින් සෘජුවම කාර්මික තාක්ෂණ ආයතනය (ITI) වෙතින් සිදුකර නොතිබුණු අතර බලපත්‍ර අයදුම්කරු විසින් කාර්මික තාක්ෂණ ආයතනය (ITI) වෙතින් එම පරීක්ෂාවන් සිදුකර ගෙන ඉදිරිපත් කරන සහතික මත බලපත්‍ර නිකුත් කර තිබුණි. | පරීක්ෂණ සිදුකර අදාළ වාර්තා සෘජුවම ලබා ගැනීමට කටයුතු කළ යුතුය. | |
| (iv) | බලපත්‍ර නිකුත් කරන ලද ආනයනික හා දේශීය ඖෂධ වර්ගවල සාම්පල් වෙළඳපොළ තුළින් ලබාගෙන තාක්ෂණික පරීක්ෂාවට ලක්කිරීමෙන් පාරිභෝගික ආරක්ෂාව තහවුරු කිරීමට කටයුතු කර නොතිබුණි. | පාරිභෝගික ආරක්ෂාව තහවුරු කිරීම සඳහා අවශ්‍ය තාක්ෂණික පරීක්ෂාවන් සිදුකළ යුතුය. | අදහස් දක්වා නැත. |
| (v) | ඖෂධ සාම්පල් ලියාපදිංචිය හා බලපත්‍ර නිකුත් කිරීම සම්බන්ධ ලිපිගොනු ශිල්පීය අංශය තුළ අනාරක්ෂිතව හා අවිධිමත් ලෙස පැවතුණි. අංශයේ ප්‍රධාන කාර්යභාරය ඉටුකිරීමේදී නිරන්තරයෙන් පෞද්ගලික සමාගම් හා ආයතන සමඟ සෘජු සම්බන්ධතා පැවැත්විය යුතු වුවත්, ඊට සරිලන පරිදි ආරක්ෂිතව හා විධිමත්ව ලිපි ගොනු පවත්වා ගැනීමට කටයුතුකර නොතිබුණි. | ශිල්පීය අංශය සුදුසු පරිදි විධිමත් කිරීමට කඩිනමින් පියවර ගත යුතුය. | අදහස් දක්වා නැත. |
| (එ) | ආයුර්වේද ප්‍රජා සෞඛ්‍ය වෛද්‍ය සහකාර නිලධාරීන් 308 දෙනෙකු බස්නාහිර, මධ්‍යම හා සබරගමුව පළාත් හැර සෙසු පළාත්වල වකුගඩු රෝගය බහුලව පවතින ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල වර්ෂ 5 ක අනිවාර්යය සේවා කාලයකට යටත්ව 2014 ඔක්තෝබර් 01 දින සිට ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවයේ ප්‍රාථමික ශ්‍රේණියේ වෛද්‍ය නිලධාරී තනතුරට අන්තර්ග්‍රහණය කිරීම සඳහා 2014 ඔක්තෝබර් 10 දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී තිබුණි. නමුත් අමාත්‍ය මණ්ඩල අනුමැතියට පටහැනිව 2018 | අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව කටයුතු කළ යුතු අතර, ඊට පටහැනිව කටයුතු කිරීම් නිවැරදි කිරීමටත්, සියළු ප්‍රජා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන් වෙත වකුගඩු රෝග නිවාරණයට අදාළව රාජකාරි පැවරීමට, අධීක්ෂණයට හා ඇගයීමට කටයුතු කළ යුතුය. | අදහස් දක්වා නැත. |

| | | | |
|---|---|---|---|
| | දෙසැම්බර් 31 දින වන විට ආයුර්වේද වෛද්‍ය සේවයේ ප්‍රාථමික ශ්‍රේණියේ වෛද්‍ය නිලධාරීන් 164 දෙනෙකු බස්නාහිර, මධ්‍යම හා සබරගමු පළාත්වලට අනුයුක්තකර තිබුණි.<br><br>2014 වර්ෂයේ සිට ක්‍රියාත්මක කර තිබුණු මෙම වැඩසටහන යටතේ එම නිලධාරීන් 164 දෙනා වෙත වකුගඩු රෝග නිවාරණයට අදාළව රාජකාරි පවරා නොතිබුණු අතර ඒ පිළිබඳ ඇගයීමක් හෝ අධීක්ෂණයක් සිදුකර නොතිබුණි. 2018 වර්ෂය තුළදී පමණක් එම නිලධාරීන් 164 දෙනා වෙත ගෙවා තිබුණු වැටුප් හා දීමනා රු.මිලියන 197.28 ක් විය. | | |
| (ඒ) | දේශීය වෛද්‍ය ක්‍රමය පදනම් කරගෙන ප්‍රමාණවත් සෞඛ්‍ය පහසුකම් නොමැති ග්‍රාමීය පොදු ජනතාවගේ ජීවිත නගා සිටුවීම අරමුණු කරගෙන දේශීය වෛද්‍ය ක්‍රම තුළින් ප්‍රජා සෞඛ්‍ය පහසුකම් සැලැසීමේ ව්‍යාපෘතිය වෙත 2015 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා කාලය තුළ සලසා තිබුණු ප්‍රතිපාදන හා තථ්‍ය වියදම පිළිවෙලින් රු.මිලියන 502.49 ක් හා රු.මිලියන 473.62 ක් විය.<br>ව්‍යාපෘතිය ආරම්භයේ සිටම විධිමත්ව පිළියෙල කරන ලද ක්‍රියාකාරී සැලැස්මකට අනුව කටයුතු කර නොතිබුණු බැවින් විධිමත්ව ප්‍රගතිය වාර්තා කිරීමක් සිදුකර නොතිබුණි. ඒ වෙනුවට මාසික දැනුවත් කිරීමේ වැඩසටහන් සිදු කරන ප්‍රමාණය ප්‍රගතිය ලෙස වාර්තා කර තිබුණි. | විධිමත් පරිදි පිළියෙල කළ ක්‍රියාකාරී සැලැස්මක් අනුව ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරිමත්, ඒ සම්බනධයෙන් පසුවිපරම් කිරීමක් කළ යුතුවීම. | අදහස් දක්වා නැත. |
| (ඔ) | නිදන්ගත වකුගඩු රෝග නිවාරණය සඳහා වූ දේශීය ප්‍රතිකාර ප්‍රවර්ධන වැඩ සටහන ක්‍රියාකාරකම් 6 ක් යටතේ ක්‍රියාත්මක කිරීමට, වකුගඩු රෝග නිවාරණ ජනාධිපති කාර්යසාධන බලකාය විසින් 2018 අගෝස්තු 01 දින සිට මාස 6 ක | නීති රීති හා රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර ව්‍යාපෘතියේ අරමුණු නියමිත කාල වකවානු තුළ ඉටුකර ගැනීමට කටයුතු කළ යුතුය. | අදහස් දක්වා නැත. |

| | | | |
|---|---|---|---|
| | කාලයක් සඳහා රු.මිලියන 5.83 ක ප්‍රතිපාදන අනුමත කර මුළු ප්‍රතිපාදන මුදලම 2018 අගෝස්තු 23 දින ආයුර්වේද දෙපාර්තමේන්තුව වෙත චෙක්පතක් මගින් ලබාදී තිබුණි.<br>වැඩ සටහනේ කාලය 2019 පෙබරවාරි 01 දින සිට තවදුරටත් මාස 6 කින් දීර්ඝකර තිබුණු නමුත් 2019 අප්‍රේල් 30 දින වන විටත් වැඩ සටහනේ ප්‍රධාන ක්‍රියාකාරකම් 6 කින් 3 ක් පමණක් ඉටු කර තිබුණු අතර ඒ සඳහා රු.591,366 ක් වැයකර තිබුණි.<br>මෙම වැඩසටහනට ප්‍රතිපාදන වෙන්කර තිබුණු ජනාධිපති සහකාර ලේකම්ගේ 2018 අගෝස්තු 23 වන දිනැති ලිපියට අනුව වැඩසටහනට සම්බන්ධිත පාර්ශවයන් විසින් වැඩසටහනේ මූල්‍ය හා භෞතික ප්‍රගතිය මාසිකව වකුගඩු රෝග නිවාරණ ජනාධිපති කාර්යසාධන බලකායට වාර්තා කළ යුතු වුවද, එම වාර්තා යවා නොතිබුණි. | | |
| (ඕ) | ශ්‍රී ලංකාවේ දේශීය වෛද්‍ය ක්‍රම මත පදනම් වූ ඖෂධ නිෂ්පාදන කර්මාන්තය සඳහා ප්‍රමිතිගත අමුද්‍රව්‍ය සපයාගැනීමේ අභිප්‍රායෙන්, ගොවි සහභාගීත්ව ඔසු වගා ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම සඳහා 2017 වර්ෂයේදී දේශීය අරමුදල්වලින් රු.මිලියන 20 ක ප්‍රතිපාදන සලසා තිබුණු අතර ඉන් රු.මිලියන 3.73 ක් පමණක් උපයෝජනය කර තිබුණි. 2018 වර්ෂයේදී මෙම ව්‍යාපෘතිය සඳහා ප්‍රතිපාදන සලසා නොතිබුණි. තරුණ ඔසු ගොවි ව්‍යාපෘතිය සඳහා සලසා තිබුණු රු.මිලියන 3 ක ප්‍රතිපාදන හා මුදල් රෙගුලාසි 66 මාරුකිරීම් වලින් ලද රු.මිලියන 2 ක ප්‍රතිපාදනවලින් රු.මිලියන 2.50 ක් මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් උපයෝජනය කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය. | ව්‍යාපෘති අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා විධිමත් සැලැසුම් පිළියෙල කර කාල පමාවකින් තොරව ව්‍යාපෘති අරමුණු ඉටුකර ගැනීමට කටයුතු කළ යුතුය. | අදහස් දක්වා නැත. |
| | (i) මෙම ව්‍යාපෘතියට අදාළව 2018 | | |

වර්ෂයේ විස්තරාත්මක ක්‍රියාකාරී සැලැස්ම හා ප්‍රගති වාර්තා 2019 මැයි 24 දින වන විටත් විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි.

(ii) රජය සතු ඉඩම් ගොවීන් 2,000 ක් වෙත ලබාදීමටත්, අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන ලබාදී තෝරාගත් දිස්ත්‍රික්ක 5 ක ඖෂධීය ශාක වගාකිරීමට සැලැසුම් කර ඇති බව මෙම ව්‍යාපෘතිය සඳහා ඉදිරිපත් කර තිබුණු අමාත්‍ය මණ්ඩල සංදේශයේ සඳහන් කර තිබුණි. විගණනය වෙත ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව 2017 වර්ෂයේදී හඳුනාගත් දිස්ත්‍රික්ක 5 කින් දිස්ත්‍රික්ක 3 ක ගොවීන් 96 දෙනෙක් පමණක් හඳුනාගෙන තිබුණු අතර එම ගොවීන් සංඛ්‍යාව සමාලෝචිත වර්ෂයේදී 92 දෙදෙනෙකු දක්වා අඩුවී තිබුණි.

(iii) පොල්පිතිගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය යටතේ රාවා ඇල ග්‍රාම නිලධාරි වසම හා බෝගොල්ල ග්‍රාම නිලධාරි වසම තුළ ක්‍රියාත්මක කර තිබුණු ඔසු වගා ව්‍යාපෘති කාර්යයන් ඉටු කිරීම සඳහා 2017 හා 2018 වර්ෂයන් තුළදී ලබාදී තිබුණු ප්‍රතිපාදන රු.මිලියන 1.42 ක් පිළිබඳව සිදුකළ විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

| | | |
|---|---|---|
| ❖ රාවා ඇල වසමේ ආයුර්වේද සංරක්ෂණ සඳහා ඉඩමේ පැල වගා කිරීම සඳහා රු.75,000 ක ප්‍රතිපාදන ලබාදී තිබුණද, 2018 සැප්තැම්බර් 12 දින වන විටත් පැල වගා කිරීම සඳහා භූමිය සකස්කර නොතිබුණි. එසේම | විධිමත් පරීක්ෂණයක් පවත්වා වගකිව යුතු නිලධාරීන්ට එරෙහිව විනයානුකූලව කටයුතු කළ යුතුය. ව්‍යාපෘති අරමුණ ඉටුකර ගැනීමට පියවර ගත යුතුය. | නිරීක්ෂණය පිළිගන්නා බව. |

| | | |
|---|---|---|
| දෙපාර්තමේන්තුව විසින් ඔසුපැල 350 ක් ලබාදී තිබුණු අතර පැල ආරක්ෂා කිරීමට විධිමත් ක්‍රමවේද අනුගමනය නොකිරීම හේතුවෙන් ඉන් පැල 250 කට අධික ප්‍රමාණයක් විනාශ වී හිස් පස් පිරවුම් පමණක් ඉතිරිවී තිබුණි. | | |
| ❖ ඉඩම් ශුද්ධ කිරීම හා වැට ඉදි කිරීම සඳහා රාවා ඇල වසමට ලබාදී තිබුණු ප්‍රතිපාදන රු.397,485 ක් වූ නමුත් අක්කර 2 ½ වූ ඉඩමේ කොටසක පමණක් කම්බි වැට ඉදි කර තිබුණි. | -ඉහත පරිදි- | නිරීක්ෂණය පිළිගන්නා බව. |
| ❖ බෝගොල්ල වසම තුළ වගා ලිඳක් ඉදිකිරීම සඳහා රු.867,035 ක ප්‍රතිපාදන සලසා තිබුණු නමුත් 2018 සැප්තැම්බර් 12 දින වන විටත් එම ලිඳ ඉදිකර නොතිබුණි. එසේම ඉඩමේ පස් සකස් කිරීම හා පැල සිටුවීම සඳහා රු.90,000 ක් යාය 04 හි බෝගොල්ල ගොවි සංවිධානය වෙත 2017 දෙසැම්බර් 29 දින ගෙවා තිබුණද 2018 සැප්තැම්බර් 12 දින වන විටත් එම කාර්යය ඉටුකර නොතිබුණි. | -ඉහත පරිදි - | නිරීක්ෂණය පිළිගන්නා බව. |
| ❖ බෝගොල්ල වසමේ තෝරාගත් ඉඩම් කොටස තුළ සිටුවීම සඳහා කරාඹුනැටි, සැවැන්දරා, ගොන් කැකිරි පැල 300 කට ආසන්න ප්‍රමාණයක් ලබාදී තිබුණද එම පැල සියල්ල දැඩි නියඟයෙන් ආරක්ෂා කිරීමට විධිමත් | -ඉහත පරිදි- | නියඟය නිසා පැල විනාශ වූ බව. |

| | | | |
|---|---|---|---|
| | ක්‍රමවේද අනුගමනය නොකිරීම හේතුවෙන් විනාශවී තිබුණි. | | |
| (ක) | 2012 ජූලි 13 දින දෙපාර්තමේන්තුවෙන් වෙන්නප්පුව ප්‍රාදේශීය සභාව වෙත ස්ථානමාරුවී ගිය වෛද්‍යවරයෙකුට එතැන් සිට මාස 15 ක් සඳහා රු.548,376 ක වැටුප් ගෙවා තිබුණි. ඉන් රු.200,000 ක් ආපසු අයකරගෙන තිබුණු නමුත් ඉතිරි රු.348,376 ක් සහ රජයේ ගාස්තු රු.137,094 ක් ඇතුළත් මුළු මුදල රු.485,470 ක් අයකරගෙන නොතිබුණි. | වැඩිපුර ගෙවීම සඳහා වගකීමට ලක්වන පාර්ශවයන් සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කිරීමටද එම මුදල නැවත අයකර ගැනීමටද කටයුතු කළ යුතුය. | මේ සම්බන්ධව වයඹ පළාත්සභාව විසින් පවත්වනු ලබන මූලික විමර්ශනය අවසන් වී නොමැති බව හා වෙන්නප්පුව ප්‍රාදේශීය සභාවෙන් අවශ්‍ය ක්‍රියා මාර්ග ගන්නා බව. |
| (ග) | 2017 වර්ෂයේදී රු.මිලියන 4.67 ක් වැයකර මෙට්ට සහිත ඇඳන් 52 ක් නාවින්න ආයුර්වේද පර්යේෂණායතනයට මිලදී ගෙන තිබුණි. නමුත් එම ඇඳන් හා මෙට්ට ප්‍රමිතියෙන් බාල බවත්, ඇඳන් නිෂ්පාදනය සඳහා භාවිත කර තිබුණු තහඩු තියුණුවීම මත ඇඳන්වල පැති ඇදී කෙලවර තුනීවීම නිසා රෝගීන් තුවාලවීමට හැකියාවක් පවතින බවත්, දින 2 ක සිට දින 3 ක් දක්වා කාලයකදී මෙට්ට වළ ගැසී ඇති බවත් හා ඇඳ ඇතිරිල්ල සමග රෝගීන් ලිස්සා යන බවත් ආයුර්වේද පර්යේෂණායතනයේ විශේෂඥ වෛද්‍යවරිය විසින් ආයුර්වේද කොමසාරිස්වරයාව දැනුවත් කර තිබුණි. ඉන් පසු මෙට්ට නැවත පිළිසකර කර තිබුණද තවදුරටත් ඒවා පාවිච්චි කළ නොහැකි තත්ත්වයෙන් පැවතුණි. | ප්‍රමිතියෙන් උසස් පාවිච්චි කළ හැකි තත්ත්වයෙන් යුක්ත ඇඳන් හා මෙට්ට සපයා ගැනීමට කටයුතු කළ යුතුය. | මෙට්ට සඳහා ගෙවීම් සිදු කර නොමැති බැවින් රජයට අවාසියක් සිදුව නැති බව. |
| (ච) | බොරැල්ල ආයුර්වේද රෝහලේ නව ගොඩනැගිල්ල ඉදිකිරීමේ සැලැසුම්වලට හා ඉංජිනේරු ඇස්තමේන්තුවට ප්‍රධාන ජල ටැංකිය (water sump) හා පල්දෝරු පද්ධතිය ඇතුළත් කර නොතිබුණු බැවින් එම අයිතම දෙක රහිතව රු.මිලියන 1,164.12 ක් වැය කර ඉදිකර තිබුණු ගොඩනැගිල්ලේ වැඩ අවසන් කර 2018 දෙසැම්බර් | අවශ්‍යතා නිසි පරිදි හඳුනාගෙන සැලැසුම් නිර්මාණය කළ යුතුවේ. එසේ නොකර, කොන්ත්‍රාත්තුව පිරිනැමීමෙන් පසු අවශ්‍යතා හඳුනා ගැනීම තුළ රජයට දැරීමට සිදුවන අධික වියදම සඳහා වූ වගකීම් අදාළ | මේ පිළිබඳ පසුව පිළිතුරු සපයන බව. |

| | | | |
|---|---|---|---|
| | 31 දින වන විට දෙපාර්තමේන්තුවට භාරදී තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.<br>(i) 2019 අප්‍රේල් 30 දින වන විටත් ගොඩනැගිල්ල උපයෝජනයකින් තොරව පැවතුණි.<br>(ii) මුළු පිරිවැය රු.මිලියන 7.37 ක් වූ රූපවාහිනි යන්ත්‍ර 200 ක්, වතුර රත් කරන ගීසර් (water geezers) 108 ක් හා වායු සමීකරණ යන්ත්‍ර සවිකර තිබුණු නමුත් ඒවායේ වගකීම් කාලය ඉකුත් වන තෙක්ම ගොඩනැගිල්ල භාවිතයට ගත නොහැකිවී තිබුණි.<br>(iii) කොන්ත්‍රාත් ගිවිසුම ප්‍රකාරව, නියමිත කාලය තුළදී කොන්ත්‍රාත්කරුගෙන් වැඩ ඉටුකරවා ගැනීමටත්, ප්‍රමාදයකින් තොරව කොන්ත්‍රාත්කරුට ගෙවීම් කිරීමටත් කටයුතු කළ යුතුව තිබුණු නමුත්, 2015 වර්ෂයේ සිට ඒ ඒ වර්ෂ සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදන සලසා ගෙන නොතිබුණු බැවින් කොන්ත්‍රාත්කරු ඉදිරිපත් කර තිබුණු බිල්පත් සඳහා නියමිත කාලය තුළදී ගෙවීම් කිරීමට අපොහොසත් වී තිබුණි. බිල්පත් සඳහා ගෙවීම් කිරීම ප්‍රමාදවීම මත කොන්ත්‍රාත්කරු විසින් රු.මිලියන 27.91 ක ප්‍රමාද ගාස්තු සඳහා ඉල්ලීම් කර තිබුණි. | නිලධාරීන් වෙත පැවරිය යුතුය. | |
| (ජ) | 2011 මැයි මාසයේදී රු.381,200 ක් වැයකර මිලදී ගෙන තිබුණු ඇඟිලි සලකුණු යන්ත්‍ර 07 කින් යන්ත්‍ර 06 ක වාර්තා, පැමිණීම හා පිටවීම තහවුරු කිරීමට භාවිතා කර නොතිබුණි. ඇඟිලි සලකුණු යන්ත්‍රය මගින් සනාථ කර නොගත් කාලය පදනම් කර ගෙන අතිකාල හා නිවාඩු දින වැටුප් ලෙස 2018 වර්ෂය තුළදී පමණක් රු.මිලියන | 2009 අප්‍රේල් 16 දිනැති අංක 09/2009 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. | මිල දී ගත් ඇඟිලි සළකුණු යන්ත්‍ර සියල්ලම භාවිතයේ පවතී. ඇඟිළි සළකුණු යන්ත්‍ර තවත් මිල දී ගැනීම් සිදු කළ යුතු හෙයින් මිල දී ගෙන සවි කළ සැනින් චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කරන බව. |

| | | | |
|---|---|---|---|
| | 43.87 ක් ගෙවා තිබුණි. | | |
| (ට) | ආයුර්වේද ඖෂධ නිෂ්පාදනය සඳහා ඖෂධ වර්ග ලබාගැනීම, බෙදාහැරීම, ඒවා නිසි පරිදි ගණන් තැබීම සඳහා අදාළ ලේඛන හා ලියකියවිලි යාවත්කාලීනව පවත්වා ගැනීම ආදී වූ මූලික කාර්යයන් පැවරී තිබෙන අනුමත භෛසජ්ජක තනතුරු සංඛ්‍යාව 60 ක් වුවද, තථ්‍ය භෛසජ්ජක සංඛ්‍යාව 17 දෙනෙකු වූයෙන් 2019 මැයි 31 දින වන විටත් පැවති පුරප්පාඩු සංඛ්‍යාව 43 ක් වී තිබුණි.<br>2009 වර්ෂයේ සිට 2012 වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදය තුළදී පාඨමාලා ගාස්තු ලෙස රු.මිලියන 1.67 ක් වැය කර භෛසජ්ජක තනතුර සඳහා 21 දෙනෙකු පුහුණුකර තිබුණු නමුත් එම 21 දෙනා තුළ වූ තනතුර සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා නොතිබුණු 12 දෙනෙකු බඳවා ගැනීමට අමාත්‍යාංශ ලේකම්වරයා වෙත නිර්දේශ යවා තිබුණි. නමුත් අවශ්‍ය සුදුසුකම් සපුරා තිබුණු 06 දෙනෙකු බඳවා ගැනීමට කටයුතු කර නොතිබුණි. | රජයේ අරමුදල් වැය කර පුහුණුවීම් ලද සුදුසුකම්ලත් පුද්ගලයින්ගෙන් අපේක්ෂිත කාර්යසාධනය ලබා ගැනීමට කටයුතු කළ යුතුය. | මේ සම්බන්ධව අවධානය යොමුකර නිසි පියවර ගැනීමට කටයුතු කරන බව. |
| (ඩ) | දේශීය වෛද්‍ය ක්‍රම පිළිබඳ ජාතික ආයතනය විසින් 2017 වර්ෂයේදී රු.523,180 ක් වැයකර අත්පත්‍රිකා හා පෝස්ටර් මුද්‍රණය කර තිබුණි. නමුත් අත්පත්‍රිකා හා පෝස්ටර් ලැබීම් හා නිකුත් කිරීම් සම්බන්ධයෙන් විධිමත් අභ්‍යන්තර පාලන ක්‍රමවේදයක් හඳුනාගෙන ක්‍රියාත්මක කර නොතිබුණු බැවින් අත්පත්‍රිකා හා පෝස්ටර් කොපමණ ප්‍රමාණයක් මුද්‍රණය කර නිකුත් කලේද යන්න හා වර්ෂ අවසානයේ අත්පත්‍රිකා හා පෝස්ටර් ඉතිරි තොග ප්‍රමාණය පිළිබඳ විස්තර විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. | අත්පත්‍රිකා හා පෝස්ටර් නිර්මාණය, මුද්‍රණය, ගබඩාකරණය හා නිකුත් කිරීම පිළිබඳව විධිමත් අභ්‍යන්තර පාලන ක්‍රමවේදයක් හඳුනාගෙන ක්‍රියාත්මක කළ යුතුය. | අත්පත්‍රිකා හා පෝස්ටර් නිකුත් කිරීම සඳහා විධිමත් ක්‍රම වේදයක් අද වන විට ආරම්භ කර ඇති බව. |
| (ත) | විධිමත් අනුමැතියකින් තොරව, ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව විසින් 2017 වර්ෂයේදී රු.641,128 | අලෙවි කුටිය වෙනුවෙන් කුලියක් අයකර රජයේ | මේ සම්බන්ධව සොයා බලා කටයුතු කිරීමට සටහන් කර ගත් බව. |

| | | | |
|---|---|---|---|
| | ක් වැයකර බොරැල්ල ආයුර්වේද ශික්ෂණ රෝහල් පරිශ්‍රය තුළ අලෙවි මධ්‍යස්ථානයක් ඉදිකර තිබුණු අතර එහි ජල හා විදුලි වියදම දෙපාර්තමේන්තුවට වැය බරක් වී තිබුණි. සාධාරණ කුලියක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ආදායමට බැර කළ යුතුය. | |
| (ප) | බොරැල්ල ආයුර්වේද ශික්ෂණ රෝහල් පරිශ්‍රය තුළ පවත්වාගෙන යනු ලබන ජාතික පශු සම්පත් මණ්ඩලයේ (NLDB) කිරි අලෙවි මධ්‍යස්ථානය වෙනුවෙන් 2014 වර්ෂයේ සිට කුලී අයකර නොතිබුණි. | -එම- | ආර්ථීක කුලිය අය කිරීමට කටයුතු කරන බව. |
| (බ) | බොරැල්ල ආයුර්වේද ශික්ෂණ රෝහලේ රසායනාගාරයේ සවිකර තිබුණු වායු සමීකරණ යන්ත්‍ර දෙකින් එකක් සම්පූර්ණයෙන් අක්‍රියවී තිබීම හා ඉතිරි යන්ත්‍රය වරින්වර අක්‍රියවීම රසායනාගාරයේ ස්ථාපිත මසකට full blood count පරීක්ෂණ 100ක් පමණ සිදුකළ හැකි Hematology Analyzer යන්ත්‍රයේ ක්‍රියාකාරීත්වය සඳහා සෘජු බලපෑමක් ඇතිකර තිබුණි. රෝගී සත්කාර සේවාවන් අඛණ්ඩව පවත්වා ගැනීමේ අරමුණින් 2018 මාර්තු 12 දින රු.400,000 ක් වැයකර වායු සමීකරණ යන්ත්‍ර 02 ක් එම රසායනාගාරයේ සවිකර තිබුණු නමුත් මෙම වායුසමීකරණ යන්ත්‍ර සඳහා අවශ්‍ය තෙකලා විදුලිය සැපයුම ලබා ගෙන නොතිබීම හේතුවෙන් 2019 මැයි 02 දින වන විටත් වායු සමීකරණ යන්ත්‍ර 02 ම ක්‍රියාත්මක කළ නොහැකිවීම නිසා full blood count පරීක්ෂණ සිදු කිරීමේ අපහසුතාවයක් පැවතුණි. | තෙකලා විදුලිය සැපයුම ලබා ගෙන පිළියම් යෙදිය යුතුය. | මේ සම්බන්ධව ප්‍රමාදයක් සිදු වී ඇති අතර ඉතා ඉක්මනින් එය නිවැරදි කිරීමට සංවර්ධන අංශයට උපදෙස් දුන් බව. |
| (ම) | බොරැල්ල ආයුර්වේද ශික්ෂණ රෝහලේ ගාස්තු අයකරන කාමර 20 කින් සමන්විත පංචකර්ම ගොඩනැගිල්ලේ වහල අබලන්ව පැවතීම, සිවිලිමෙන් ජලය වෑස්සීම හා ටයිල් ගැලවීම ආදී හේතූන් මත | නිසි පරිදි අළුත්වැඩියාවන් සිදුකර කාමර දෙක විවෘත කිරීමට කටයුතු කළ යුතුය. | දැනට මෙය ක්‍රියාත්මක තත්ත්වයේ පවතින බව. |

| | | | |
|---|---|---|---|
| | කාමර 02 ක් වර්ෂ 03 ක පමණ කාලයක සිට වසා දමා තිබීම නිසා අහිමි වී තිබුණු ආදායම රු.මිලියන 2.16 ක් වුවද සිදුකළ යුතු අළුත්වැඩියාවන් කිරීමට කටයුතු කර නොතිබුණි. | | |
| (ය) | බොරැල්ල ආයුර්වේද රෝහල් පරිපාලන කටයුතු සිදු කරන කාර්යාල පරිශ්‍රයේ අංක 02 හා අංක 05 දරන පංචකර්ම වාට්ටු දෙකෙහි සහ ගෙවන වාට්ටු දෙක ආවරණය වන පරිදි සවිකර තිබුණු විදුලි ජනක යන්ත්‍රය සවිකිරීමෙන් පසු යන්ත්‍ර පැය 10 ක් පමණක් ක්‍රියාකර තිබුණු බවත්, එය 2010 වර්ෂයෙන් පසුව භාවිතාකර නොතිබුණු බවත් අනාවරණය විය. මෙම යන්ත්‍රයේ ආරක්ෂාව සඳහා ප්‍රමාණවත් විධිවිධාන සලසා නොතිබීම හේතුවෙන් යන්ත්‍රයේ අභ්‍යන්තර පද්ධතිය (panel board) මීයන් විසින් කා දමා තිබුණු අතර 2019 මැයි 02 දින වන විටත් උපයෝජනය කර නොතිබුණි. | දෙපාර්තමේන්තුව සතු සියළුම වත්කම්වල ආරක්ෂාව තහවුරු කළ යුතුය. | මී උවදුර පාලනය කිරීමට පියවර ගෙන ඇති බව හා ඉදිරි දෙසතිය තුළ අලුත්වැඩියාව සිදු කළ හැකි බව. |
| (ර) | අක්ෂි රෝග, කැඩුම් බිඳුම්, දැවුම් පිළිස්සුම්, සර්ප විෂ, මානසික රෝග, ගෙඩිවන හා පිළිකා යනාදී වශයෙන් වූ රෝග සම්බන්ධයෙන් පාරම්පරික විශේෂ වෛද්‍යවරුන් 20 දෙනෙකු කොන්ත්‍රාත් පදනම මත බඳවා ගෙන ආයුර්වේද රෝහල් 06 ක් වෙත අනුයුක්ත කර තිබුණු අතර සමාලෝචිත වර්ෂයේදී ඒ සඳහා රු.මිලියන 5.96 ක් දීමනා ලෙස ගෙවා තිබුණි. විශේෂ වෛද්‍යවරුන් බඳවා ගැනීමට ඇති අධිකාරී බලය, විශේෂ වෛද්‍යවරුන් 20 දෙනෙකු බඳවා ගැනීම සඳහා ලැබුණු අනුමැතිය හා එම 20 දෙනා තෝරාගත් පදනම මෙන්ම ඔවුන්ගේ පෞද්ගලික ලිපිගොනු විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. | පාරම්පරික විශේෂ ආයුර්වේද වෛද්‍යවරුන් බඳවා ගැනීම සඳහා ලැබුණු අනුමැතිය, තෝරාගත් පදනම මෙන්ම ඔවුන්ගේ පෞද්ගලික ලිපිගොනු විගණනය සඳහා ඉදිරිපත් කළ යුතුය. | දැනට මෙම පාරම්පරික වෛද්‍යවරුන්ගෙන් උපරිම සේවාවක් ලබා ගන්නා බව, වෛද්‍යයරුන්ගේ ලිපි ගොනු සොයා ගත නොහැකි බව. |
| | දේශීය වෛද්‍ය විද්‍යාලවල ශිෂ්‍යයින්ට ඉගැන්වීම සඳහා යොමු | අරමුණු ඉටුකර ගැනීම සඳහා විධිමත් | ඉගැන්වීමේ කටයුතු හා අවශ්‍ය දැනුම ලබා දීමේ |

| | | | |
|---|---|---|---|
| | කරමින් ආයුර්වේද වෛද්‍ය සේවයට ප්‍රශංසනීය දායකත්වයක් මොවුන්ගෙන් ලබා ගැනීම අපේක්ෂාව වුවද, එම අරමුණු ඉටුකර ගැනීම සඳහා විධිමත් ක්‍රමවේදයක් හඳුනාගෙන නොතිබුණි. | ක්‍රමවේදයක් හඳුනාගෙන ක්‍රියාත්මක කළ යුතුය. | කටයුතු වල නියැලෙන බව හා විධිමත් ක්‍රමවේදයක් ස්ථාපනය කරන බව. |
| (ල) | 1962 වර්ෂයේදී නාවින්න ආයුර්වේද පර්යේෂණ රෝහල ස්ථාපිත කිරීමෙන් පසුව 2017 වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදය තුළදී තවත් ආයුර්වේද පර්යේෂණ රෝහල් 04 ක් ස්ථාපිත කර තිබුණි. කෙසේ වුවද, එම රෝහල්වලින් රෝග පිළිබඳව පර්යේෂණ සිදු කරන බවට හෝ සිදුකරන ලද පර්යේෂණවලින් ලද නව සොයා ගැනීම් පිළිබඳව හා ඒ පිළිබඳ මහජනයා දැනුවත් කිරීම්වලට අදාළ සාක්ෂි විගණනය සඳහා ඉදිරිපත් නොකෙරුණි. තවද පර්යේෂණයක් සිදු කිරීමේදී අනුගමනය කළ යුතු ක්‍රමවේදය හා ඒ පිළිබඳ නිශ්චිත උපදෙස් නිකුත් කිරීමට කටයුතු කර නොතිබුණි. | පර්යේෂණ ක්‍රමවේදය හා ඒ පිළිබඳ නිශ්චිත උපදෙස් නිකුත් කිරීමට කටයුතු කළ යුතුය. පර්යේෂණ පිළිබඳ තොරතුරු පද්ධතියක් පවත්වා ගැනීමට කටයුතු කළ යුතුය. නව සොයාගැනීම් පිළිබඳව මහජනතාව දැනුවත් කිරීමේ ක්‍රමවේදයක් පිළියෙල කළ යුතුය. | තොරතුරු ඉදිරියේදී විගණනයට ඉදිරිපත් කරන බව. |
| (ව) | බොරැල්ල ආයුර්වේද ශික්ෂණ රෝහලේ රෝගී සංඛ්‍යා ලේඛන ඊළඟ මාසයේ 10 දිනට පෙර ලබාදෙන ලෙස දැනුම්දී තිබුණු නමුත් අදාළ වෛද්‍ය නිලධාරීන් විසින් එම සංඛ්‍යා ලේඛන ඒ අනුව ඉදිරිපත් කර නොතිබුණු අතර 2018 වර්ෂයට අදාළ සංඛ්‍යා ලේඛන 2019 ජනවාරි මාසය වන විටත් සම්පූර්ණ කර නොතිබුණි. රෝගී සංඛ්‍යා ලේඛන ලබාගැනීමට නිශ්චිත ආකෘති පත්‍රයක් හඳුන්වා දී නොතිබුණු අතර ස්ත්‍රී පුරුෂ භාවය, වයස, රෝගය හා පළමු හා දෙවන වර පැමිණීම යනාදී තොරතුරු රහිතව හා සහිතව විවිධ වූ ආකෘති පත්‍ර යටතේ වෛද්‍යවරුන් විසින් තොරතුරු ඉදිරිපත් කර තිබීම හේතුවෙන් එම තොරතුරු ඒකාබද්ධ කිරීමට නොහැකිවී තිබුණි. | දත්ත පරිශීලනය කරන්නන්ට හා කළමනාකාරීත්වයට විශ්වාසී ලෙස දත්ත පරිහරණය කළ හැකි පරිදි සංඛ්‍යාලේඛන හා තොරතුරු රැස් කිරීම සඳහා විධිමත් ක්‍රමවේදයක් ස්ථාපිත කළ යුතුය. | මේ වන විට රෝහලේ සංඛ්‍යා ලේඛන නිසි ආකාරයෙන් නඩත්තු කිරීම සිදු කිරීම සඳහා වෛද්‍ය නිලධාරියෙකු පත් කර ඇති බව. |

**4. තිරසර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම**

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| තිරසර සංවර්ධන අරමුණු ලඟාකර ගැනීම පිණිස ආයතනය විසින් සපුරාගත යුතු ඉලක්කයන් හා එම ඉලක්කයන් සපුරා ගැනීම සඳහා පවතින පරතරයන්ද, ප්‍රගතිය මැන බැලීම සඳහා සුදුසු දර්ශකයන්ද හඳුනාගත යුතු වුවද, දෙපාර්තමේන්තුව විසින් එවැනි දර්ශකයන් හඳුනාගෙන අරමුණුවලින් ලඟාකරගත් ප්‍රමාණය හා බැහැරවීම් මෙන්ම අවධානය යොමු කළයුතු විවිධ ක්ෂේත්‍රයන් හඳුනාගෙන නොතිබුණි. | තිරසර සංවර්ධන අරමුණු ලගාකර ගැනීමට අදාළව ඉලක්ක, දර්ශක හඳුනා ගැනීම හා ප්‍රගතිය මිණුම් කිරීමට කටයුතු කර ඉන් බැහැරවීම් පිළිබඳ අවධානය යොමු කළ යුතුය. | නිරීක්ෂණය සමඟ එකග වන බව හා මේ සම්බන්ධව සංවර්ධන අංශය දැනුවත් කර අවශ්‍ය දර්ශකයන් සකස් කිරීමට උපදෙස් දුන් බව. |

**5. යහපාලනය**

---

**5.1 මහජනයා වෙත සේවා ඉටු කිරීම**

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවිය යාවත්කාලීන කර නොතිබුණු අතර උප ආයතන හා ආයුර්වේද රෝහල්වලින් ඉටුවන කාර්යයන් හා සේවා පිළිබඳ තොරතුරු වෙබ් අඩවියට ඇතුළත් කර නොතිබුණි. තවද මහජන පැමිණිලි ඉදිරිපත් කිරීමට වෙබ් අඩවි පහසුකම් සලසා නොතිබුණි. | මහජනයා වෙත ලබාදිය යුතු තොරතුරු ඉදිරිපත් වන ආකාරයෙන් වෙබ් අඩවිය යාවත්කාලීන කර පවත්වාගත යුතුය. | වෙබ් අඩවිය යාවත්කාලින කිරීම සිදුකරමින් පවතින බව. |
| (ආ) | තොරතුරු දැනගැනීමේ පනත ප්‍රකාරව, මහජනයා වෙතින් ලැබෙන ඉල්ලීම්, ප්‍රතිචාර දැක්වීම් හා පිළියම් යෙදීම් ලේඛනගත කර නොතිබුණි. | තොරතුරු දැනගැනීමේ පනත ප්‍රකාරව තොරතුරු ඉල්ලීම්, ප්‍රතිචාර දැක්වීම් හා පිළියම් යෙදීම් ලේඛනගත කළ යුතුවේ. | දෙපාර්තමේන්තුවේ සියලුම උපකාර්යාල සඳහා තොරතුරු දැනගැනීමේ නිලධාරීන් පත්කර තිබුණද ශ්‍රම සම්පත අඩුකම නිසා එම නිලධාරීන්ද ආයතන කටයුතු වල නිරත වේ. එබැවින් |

| | | |
|---|---|---|
| | | විගණන නිරීක්ෂණය පරිදි සියයට සීයක් සම්පූර්ණව සියලු කාර්යය ඉටුකළ නොහැකි බව. |

**5.2** **අභ්‍යන්තර විගණනය**

**-----------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) ආයුර්වේද රෝහල් හා උප ආයතන 10 ක් සහ ඔසු උයන් 06 ක් ඇතුළු සමස්ත දෙපාර්තමේන්තුවේද, ආයුර්වේද වෛද්‍ය සභාවේද අභ්‍යන්තර විගණනය සඳහා ප්‍රධාන අභ්‍යන්තර විගණක සමඟ තවත් නිලධාරීන් දෙදෙනෙකු පමණක් අනුයුක්ත කර තිබුණි. එම නිලධාරීන් දෙදෙනා සෑම වර්ෂයකම ජනවාරි මාසයේ සිට අගෝස්තු මාසය දක්වා කාලපරිච්ඡේදය තුළ භාණ්ඩ සමීක්ෂණ රාජකාරි කටයුතු හා ඔසුපැන් ලබාදීමේ විවිධ වැඩසටහන් සඳහා අනුයුක්ත කර තිබීම හේතුවෙන්, මුදල් රෙගුලාසි 134(1) ප්‍රකාරව, අභ්‍යන්තර විගණන ඒකකයේ ස්වාධීනත්වය තහවුරු වී නොතිබුණි. | මුදල් රෙගුලාසි 133 හා 134 ප්‍රකාරව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40 වගන්තිය ප්‍රකාරව කටයුතු කළ යුතුය. | අභ්‍යන්තර විගණන ඒකකයේ ස්වාධීනත්වය තහවුරු වී නොතිබීම පිළිබඳ එකඟ බව. ඉදිරියේදී අභ්‍යන්තර විගණන නිලධාරී තනතුර වෙනුවට ප්‍රධාන අභ්‍යන්තර විගණන නිලධාරී තනතුරක් ඇති කර කාර්ය මණ්ඩල ස්ථාපිත කර ස්වාධීන කටයුතු කිරීමට විගණන ඒකකය පිහිටුවන බව. |
| (ආ) මුදල් රෙගුලාසි 134(2) ප්‍රකාරව, අභ්‍යන්තර විගණන සැලැස්ම අනුව සමාලෝචිත වර්ෂයේදී ක්ෂේත්‍ර 18 ක් යටතේ ප්‍රධාන විගණන කාර්යයන් 31 ක් ඉටු කිරීමට සැලසුම් කර තිබුණු නමුත් අභ්‍යන්තර විගණන සැලැස්මට අනුව ප්‍රගති වාර්තාව පිළියෙල කර නොතිබුණු බැවින් අභ්‍යන්තර විගණන අංශයේ කාර්යසාධන මට්ටම ඇගයීමට නොහැකි විය. | මුදල් රෙගුලාසි 134 ප්‍රකාරව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40 වගන්තිය ප්‍රකාරව අභ්‍යන්තර විගණනය සිදුකළ යුතුය. | අභ්‍යන්තර විගණන සැලැස්ම පිළියෙල කර ඇති නමුත් එම සැලසුමට අනුව කටයුතු කිරීමට සේවක පුරප්පාඩු පැවතීම හේතුවෙන් නොහැකි වී ඇති බව හා පුරප්පාඩු සම්පූර්ණ කළ පසු අභ්‍යන්තර විගණනයේ කාර්යසාධන මට්ටම උපරිම කර ගැනීමට කටයුතු කරන බව. |

## 5.3 විගණන හා කළමනාකරණ කමිටුව

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 41.(1)(අ) උපවගන්තිය ප්‍රකාරව, දෙපාර්තමේන්තුවේ සෑම අංශයකටම පැවරුණු කාර්යභාරයන් පිළිබඳව විගණන කළමනාකරණ කමිටුවේදී සමාලෝචනය කිරීමට කටයුතු කර නොතිබුණි. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 41 වගන්තිය ප්‍රකාරව කටයුතු කළ යුතුය. | අදහස් දක්වා නැත. |
| (ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 41(1)(ආ) උපවගන්තිය ප්‍රකාරව, දෙපාර්තමේන්තුව නිමකළ ව්‍යාපෘති, වැඩසටහන් හා සැලැසුම්වලින් අපේක්ෂිත වූ පරිදි අදාළ කාර්යයන් ක්‍රියාත්මක වන්නේද යන්න පිළිබඳව විගණන කළමනාකරණ කමිටුවේදී සමාලෝචනය කිරීමට කටයුතු කර නොතිබුණි. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 41 වගන්තිය ප්‍රකාරව කටයුතු කළ යුතුය. | අදහස් දක්වා නැත. |

## 6. මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 531 ක් තිබුණත්, 2018 වර්ෂය වෙනුවෙන් පිළියෙල කර තිබුණු මූලා ප්‍රකාශන අනුව සලසා තිබුණු ප්‍රතිපාදන උපයෝජනය නොකර ඉතිරි වී තිබුණත්, පහත සඳහන් අවස්ථාවලදී හැර එම ඉතිරියන් කෙරෙහි කාර්ය මණ්ඩල පුරප්පාඩු පැවැතීම බලපා නොතිබුණි. ඒ අනුව අනුමත කාර්ය මණ්ඩලය අධි ඇස්තමේන්තු කිරීමක් සිදු වී | පුරප්පාඩු පුරවා කාර්ය සාධනය ඉහළ නැංවීමට හෝ පුරප්පාඩු පැවතීම කාර්ය සාධනය කෙරෙහි බලපෑමක් ඇති නොකරයි නම් අනුමත කාර්ය මණ්ඩලය සංශෝධනය කර ගැනීමට හෝ | අදහස් දක්වා නැත. |

තිබුණු බව විගණනයේදී නිරීක්ෂණය විය. කටයුතු කළ යුතුය.

(අ) ආයුර්වේද දෙපාර්තමේන්තුව වෙත පැවරී තිබෙන කාර්යභාරය ඉටු කිරීමේදී විෂයගත, ආයතන හා පාලන කාර්යයන්හි නියැලෙන කළමනාකරණ සහකාර නිලධාරී තනතුරු 107ක් අනුමත වී තිබුණු නමුත් සමාලෝචිත වර්ෂය අවසානයට එම තනතුරු 37 ක් පුරප්පාඩුව පැවතුණි.

(ආ) දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයන් අතර වූ සම්මන්ත්‍රණ, අධ්‍යාපන පන්ති හා ආයුර්වේදය පිළිබඳ පාඨමාලා පැවැත්වීමේ කාර්යයන් ඉටුකර ගැනීම සඳහා පිහිටුවා තිබුණු දේශීය වෛද්‍ය ක්‍රම පිළිබඳ ජාතික ආයතනයේ (NITM) ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 16 ක් අතරින් නියෝජ්‍ය අධ්‍යක්ෂ (සාමාන්‍ය) යන ප්‍රධාන තනතුරක් හා අනුමත රාජ්‍ය කළමනාකාර සහකාර තනතුරු 06 ක් අතරින් තනතුරු 04 ක් පුරප්පාඩුව පැවතුණි.

(ඇ) දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයන් අතර වූ දේශීය වෛද්‍ය ක්‍රමය නඟා සිටුවීමට අදාළ පර්යේෂණ කටයුතු ඉටු කිරීම සඳහා ස්ථාපිත බණ්ඩාරණායක අනුස්මරණ ආයුර්වේද පර්යේෂණායතනයේ කාර්යයන් ඉටු කරගැනීමට සෘජුවම දායකත්වය ලබා ගතයුතු, ජ්‍යෙෂ්ඨ මට්ටමේ අනුමත තනතුරු 77 කින් තනතුරු 24 ක්ද, තෘතියික මට්ටමේ අනුමත තනතුරු 23 කින් තනතුරු 22 ක්ද, ද්විතීයික මට්ටමේ අනුමත තනතුරු 84 කින් තනතුරු 45 ක්ද පුරප්පාඩුව පැවතුණි.

(ඈ) 2018 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුව යටතේ ඇති රෝහල් 09 හි, රෝහලක් පවත්වාගෙන යාමට අත්‍යාවශ්‍ය තනතුරු 09 ක් යටතේ අනුමත

තනතුරු 1,021 කින් තනතුරු 275 ක් පුරප්පාඩු පැවතියද එම පුරප්පාඩු පිරවීමට කටයුතු කර නොතිබුණු අතර සමහර රෝහල්වලට අත්‍යාවශ්‍ය තනතුරු අනුමත කර ගෙන නොතිබුණි.